# ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව

## ශ්‍රී ලංකාව



ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සකස් කර
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල කමිටුව

සැප්තැම්බර් 2023

# පූර්විකාව

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු 2020 වසරේ දී ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය සහ ඉන් අනතුරුව අපේක්ෂිත අයුරින් 2021 මාර්තු මාසයේ සිට මුහුණදෙමින් සිටින ආර්ථික අභියෝග හමුවේ දැඩි ලෙස බලපෑමට ලක්ව ඇත. රජය විසින් ආර්ථික ස්ථාවරත්වය තහවුරු කරමින් යලි සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම උදෙසා, සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයම පූර්ණ ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමේ දැඩි සමාජීය ඉල්ලුම හඳුනාගනිමින්, ඉදිරි වසර 25 සඳහා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් හා ගරු අග්‍රාමාත්‍යවරයා සහ අධ්‍යාපන අමාත්‍යවරයා ද ඇතුළත් වන පරිදි සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල කමිටුවක් 2023.04.24 දින අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඊට සහාය වීම පිණිස සාමාජිකයන් විසිපස් දෙනෙකුගෙන් යුතු විද්වත් නිලධාරි කමිටුවක් ද පත් කරන ලදී.

එම විද්වත් නිලධාරි කමිටුව විසින් සකස් කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2023-2033) කෙටුම්පත මඟින් රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පරිවර්තනීය වෙනසක් සිදු කිරීම සඳහා වූ පුළුල් මෙන්ම දූරදර්ශී මාර්ග සැලැස්මක අවශ්‍යතාව පිළිබඳව සිය යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය, සමානාත්මතාව සහ විශිෂ්ටත්වය කරා එළැඹීමට අවශ්‍ය වන්නා වූ මූලික අරමුණු, ක්‍රමෝපායන් සහ ක්‍රියාමාර්ග මෙම කෙටුම්පත් රාමුව තුළින් සැකෙවින් ගෙනහැර දක්වයි. එමෙන්ම මෙම කෙටුම්පත් රාමුව, ජාතික සංවර්ධන අභිමතාර්ථ සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින ගෝලීය ඉලක්ක සමඟ ද අනුගත වන අයුරින් සකස් කර ඇත.

"වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක්" යන දැක්මට අනුකූලව සකස්ව ඇති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවෙහි කෙටුම්පත මඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පරිවර්තනීය වෙනසක් සිදු කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මූලධර්ම අන්තර්ගත කර ඇත. කෙසේ වෙතත්, වර්තමානයේ දී අත්දකිමින් සිටින සීඝ්‍ර තාක්ෂණික වර්ධනය සහිත ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සහ ශ්‍රම වෙළඳපොළෙහි සිදුවන වේගවත් විචලනයන් හේතුවෙන් වර්ෂ 2048 දක්වා දිවෙන දීර්ඝ කාලීන ප්‍රතිපත්තිමය පුරෝකථන සක්‍රියව සිදු කිරීම ප්‍රායෝගික නොවන හෙයින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ඉදිරි වසර 10 ක කාල පරාසයක් (2023 – 2033) සඳහා මෙම අවස්ථාවේදී සීමා කරමින්, යළි අනාගතයේ දී සමාලෝචනයකට ඉඩ සළසා ඇත. කෙසේ වුව ද ඉදිරි කාලය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු කිරීමට බලාපොරොත්තු වන සියලුම ආකාරයේ ප්‍රතිපත්තිමය හා විෂයානුබද්ධ ප්‍රතිසංස්කරණ මෙම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පමණක් හඳුනාගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2023 – 2033) කෙටුම්පත, අමාත්‍ය මණ්ඩලයේ සහ පාර්ලිමේන්තුවේ අනුමැතියෙන් අනතුරුව අදාළ කාල වකවානුව තුල නිසි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සහ මඟපෙන්වීම් නිරන්තරව ලබා දෙනු ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් විවිධ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වී නව ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කරවීම හා අධීක්ෂණය සඳහා වූ උපාය මාර්ග සකස් කිරීම මෙන්ම අවශ්‍ය නව නීති සහ රෙගුලාසි සම්පාදනය කිරීම ආදී කටයුතු සඳහා සක්‍රියව සහාය දැක්වීම පිණිස වගකිවයුතු කණ්ඩායමක් පත් කිරීම පිළිබඳව තීරණය කරනු ඇත. මෙම පත් කෙරෙන ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුවන ආයතන ප්‍රධානීන්ගෙන් මෙන්ම අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම් සහ රෙගුලාසි සහ නීති කෙටුම්පත් කිරීම පිළිබඳ නිපුනතාවයෙන් යුත් පුද්ගලයින්ගෙන් සමන්විත වනු ඇත.

## විධායක සාරාංශය

විෂයානුගත අන්තර්ගතයන් මඟින් සිසුන් මත පැටවෙන බර මෙන්ම තරඟකාරී විභාග කේන්ද්‍රීය වූ වර්තමාන අධ්‍යාපන ක්‍රමය මඟින් සමස්ත ශිෂ්‍ය ජනගහනයෙන් කුඩා ප්‍රතිශතයක් උසස් අධ්‍යාපන මාවතකට තෝරා ගනු ලබන අතර බහුතරයක් වූ සිසුන් තම ඉගෙනීම පිළිබඳව නිසි සහතිකකරණයක් නොමැතිව පාසල් පද්ධතියෙන් නික්ම යයි (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්තවලට අනුව 2021 දී විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් සංඛ්‍යාව 8.9%ක් පමණි). පිළිවෙලින් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා විෂයයන් 50 කට අධික සංඛ්‍යාවක් ද, අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා විෂයයන් 60 කට අධික සංඛ්‍යාවක් ද සිසුන් හට තෝරා ගැනීම සඳහා ඉදිරිපත් කරමින් පවත්වනු ලබන වත්මන් විභාග ක්‍රමය, දශක ගණනාවක් මුළුල්ලේ සිට මෙරට අධ්‍යාපන ක්‍රමයේ පදනම බවට පත්ව ඇත. මෙම අතිශය තරඟකාරී මෙන්ම වෙහෙසකාරී විභාග ක්‍රමය සිසුන් වෙත අධික බරක් මෙන්ම අනවශ්‍ය ප්‍රමාදවීම් මෙන්ම විශාල වියදමක්ද දැරීමට සිදුවන වාතාවරණයක් ඇති කරන්නක් බවට පත්ව ඇත. එබැවින් ප්‍රමාණයට වඩා ගුණාත්මකභාවයට ප්‍රමුඛත්වය දෙන වෙනස්කම් සිදු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි.

රාජ්‍ය පාසල් පද්ධතිය තුළින් ලබාදෙන අධ්‍යාපන සේවාවන්හි දක්නට ලැබෙන අනේකවිධ දුර්වලතාවයන්ට විසඳුම් ලෙස කිසිදු නියාමනයකින් තොරව ක්‍රියාත්මක වෙමින් පවතින වාණිජමය ස්වරූපයේ පෞද්ගලික අධ්‍යාපන ජාලයක් රට පුරා අතිශය අවිධිමත් අයුරින් නිර්මාණය වී ඇත. මේ හේතුවෙන් උපකාරක පන්ති ගාස්තු ලෙස දෙමව්පියන් විසින් ගෙවනු ලබන පුද්ගලික මූල්‍ය දායකත්වයන් සහ පාසල් සංවර්ධන සමිති හරහා ලැබෙන දායකත්වයන් මත අධ්‍යාපන ක්‍රමය දැඩිව රඳා පවතින තත්ත්වයක් උද්ගතව ඇත. එමෙන්ම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පෞද්ගලික ආයෝජන යොමු වීම ප්‍රබල ලෙස වැලකී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රජය විසින් අධ්‍යාපනය සඳහා දරනු ලබන සමස්ත වියදමින් විශාල ප්‍රතිශතයක් උසස් අධ්‍යාපනය සඳහා යොමු වී ඇත (PERC, 2023).

ඉහත දක්වන ලද අයහපත් තත්වයන් රාශිය හමුවේ ශ්‍රී ලංකාව සිය අධ්‍යාපන ක්ෂේත්‍රය කඩිනමින් සීඝ්‍ර පරිවර්තනයකට ලක් කළ යුතුව ඇත.

### අධ්‍යාපන පරිවර්තනය සඳහා ප්‍රතිපත්තිමය රාමුව

කෘත්‍රිම බුද්ධිය (AI) හා නැගී එන නව තාක්ෂණයන්, දේශගුණික විපර්යාස මෙන්ම දේශීය හා ගෝලීය සමාජ-ආර්ථික යථාර්ථයන්, අධ්‍යාපනය කෙරෙහි ඇතිකරනු ලබන බලපෑම් පිළිබඳව අවබෝධයකින් තොරව අධ්‍යාපනයේ පරිවර්තනයක් අපේක්ෂා කළ නොහැක.

කෘත්‍රිම බුද්ධියේ දියුණුවත් සමඟ නිර්මාණය වන අනාගත දර්ශනය වන්නේ, "පාසල් අධ්‍යාපනය ගතානුගතිකව පවත්වාගෙන යන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් එලෙසම පැවැතියද, වඩාත් පුද්ගලානුබද්ධ ඉගෙනුම් ක්‍රියාවලින් සහ වෙනත් නව මාදිලිවලින් පාසල් අධ්‍යාපනය සකස් වනු ඇත" (OECD 2022).

වඩාත් අනාගතවාදී දර්ශනයක් වන්නේ, "අධ්‍යාපනය ඕනෑම ස්ථානයක, ඕනෑම වේලාවක සිදුවිය හැකි බැවින් හා සමාජය සමස්තයක් වශයෙන් යාන්ත්‍රික  බලයට නැඹුරුවන බැවින්, විධිමත් හා අවිධිමත් ඉගෙනුම් අතර වෙනස තවදුරටත් පෙර ලෙස වලංගු නොවනු ඇත" (OECD, 2022).  එවැනි අතිශය ගතික අනාගතවාදී වාතාවරණයක් තුළ ශිෂ්‍ය ප්‍රජාවන් සඳහා තවදුරටත් අමාත්‍යාංශය මෙන්ම නියාමන ආයතන, ජාතික විභාග, සහතිකකරණය, සහ පවතින අධ්‍යාපන ව්‍යුහයන් එතරම් වැදගත් නොවිය හැකි බව මෙයින් අදහස් කෙරේ.

සීඝ්‍ර ලෙස සංවර්ධනය වෙමින් පවතින තොරතුරු තාක්ෂණ මෙන්ම කෘත්‍රිම බුද්ධි ක්ෂේත්‍රයන්ට අමතරව, දේශගුණික විපර්යාස සහ ගෝලීය සමාජ-ආර්ථිකමය තත්ත්වයන්ගේ අනාගත දිශානතියේ ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, අධ්‍යාපනයේ අනාගත දර්ශනය කෙසේ වේදැයි නිවැරදිව පුරෝකථනය කිරීම පවා අපහසු කාර්යයක් වෙමින් පවතී.

මතුවිය හැකි අනාගත අධ්‍යාපන දර්ශන කුමක් වුවත්, පවතින ගතානුගතික අධ්‍යාපන ව්‍යුහයෙහි ගැඹුරු සහ පද්ධතිමය පරිවර්තනීය වෙනස්කම් නොමැතිව ශ්‍රී ලංකාවට තවදුරටත් රටක් ලෙස ඉදිරියට යා නොහැකි වනු ඇත. විෂයමාලා ප්‍රතිසංස්කරණ, පෙළපොත්, ගුරු පුහුණු, ඩිජිටල්කරණ සහ අධ්‍යාපනයේ අනෙකුත් අනේකවිධ මෙහෙයුම් ගැටළු අරභයා මීට පෙර දැරූ උත්සාහයන්හි ප්‍රතිඵල කෙලෙසකින් හෝ තිරසාර වී නොමැති බව වර්තමාන ආර්ථික හා සමාජීය පරිහානිය සාක්ෂි දරයි. ඉහත දක්වන ලද ප්‍රතිසංස්කරණ බොහෝමයක් සමස්ත අධ්‍යාපන ව්‍යුහයේ පද්ධතිමය වෙනස්කම් සමඟ බද්ධ වී ක්‍රියාත්මක නොකිරීම ඊට ප්‍රධානතම හේතුව වී ඇත. එබැවින් ඉදිරි ඕනෑම පද්ධතිමය වෙනසක් පවත්නා අධ්‍යාපන ව්‍යුහයේ තිරසාර පරිවර්තනයකට මෙන්ම අවිනිශ්චිත අනාගතයකට මුහුණ දීමට හැකි පරිදි දැනුමෙන්, නිපුණතාවයෙන් හා ආකල්පමය වශයෙන් ශ්‍රී  ලාංකිකයන් සූදානම් කිරීමට තුඩු දෙන්නක් විය යුතුය.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ප්‍රතිපත්ති ප්‍රකාශයන්; ඉගෙනුම්, ඉගැන්වීම් හා සහතිකකරණය, යහ කළමනාකරණය, සහ ආයෝජන හා නිසි අයුරින් මානව හා භෞතික සම්පත් යෙදවීම යන ප්‍රතිපත්තිමය දිශානති තුන යටතේ ඉදිරිපත් කරනු ලබන අතර, අපේක්ෂිත පරිවර්තනීය වෙනස සඳහා අවශ්‍යතා නීති සහ රෙගුලාසි කෙටුම්පත් කිරීම සඳහා මාර්ගෝපදේශයන් සපයනු ඇත.

**2023 – 2033 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) මඟින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිරසර පරිවර්තනීය වෙනසක් සිදු කිරීම අරභයා,**

- **ඉගැනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය සඳහා වන නීති නැවත සමාලෝචනය,**
- **යහ කළමනාකරණයක් සඳහා වගකිව යුතු පාර්ශවයන් සහ ආයතන ප්‍රතිනිර්මාණය,**
- **ආයෝජන සහ සම්පත් ප්‍රශස්තකරණය,**

**යන කරුණු ආමන්ත්‍රණය කරනු ඇත.**

සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය; මුල් ළමාවිය, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය, තෘතියික අධ්‍යාපනය (උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය ඇතුළත්ව) යන අනු අංශයන්ගෙන් සමන්විත වනු ඇත. අපේක්ෂිත පුළුල් පරිවර්තන ක්‍රියාවලිය සියලු අනු අංශ සඳහා ද පොදු වන අතර ප්‍රතිපත්තිමය ප්‍රකාශනයේදී අවස්ථානුකූලව එක් එක් අනු අංශ ලෙස විග්‍රහ කරනු ලැබේ.

## පරිවර්තන ක්‍රියාවලිය

ඉදිරි වසර 10 ඇතුළත මෙරට අධ්‍යාපන ක්‍රියාවලීන් අපේක්ෂිත අයුරින් පරිවර්තනීය වෙනසකට භාජනය කිරීම පිණිස, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව අනුමත කිරීමෙන් අනතුරුව වසරක් ඇතුළත අවශ්‍ය නීති රීති, රෙගුලාසි හා නීති සම්පාදනය හා අදාළ කාර්ය සාධන දර්ශක නිශ්චිත ලෙස නිර්ණය කළ යුතුය.

පළමු වසර 4 තුළ, නව අධ්‍යාපන ප්‍රතිපත්තිමය රාමුව මඟින් අලුතින් නිර්වචනය කරන ලද ආයතනවලට අදාළ රෙගුලාසි සහ නීති සම්පාදනය කර එම ආයතන පද්ධති ස්වයං පරිපාලනයකට කඩිනමින් යොමු කළ යුතු වන අතර ඊට අනුගතව එම ආයතන අතර ද යහපත් තරඟකාරීත්වයක් ඇති වන පරිදි සිය කාර්යසාධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අත්හදා බැලීම්, ඉගෙනීමට සහ නව්‍යකරණය යනාදිය සඳහා ද ඉඩ සලසා දිය යුතුය. ස්වයං පාලනයක් සහිත පළාත් අධ්‍යාපන මණ්ඩල හා පාසැල් කළමනාකරණ මණ්ඩල ස්ථාපනය කිරීමට ප්‍රමුඛත්වය දිය යුතු ය.




**සම්පාදන අවධිය**

**එක් එක් ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි සහ නීති**

**ක්‍රියාත්මක අවධිය**

**පාර්ශවකරුවන්ට නව්‍යකරණය සිදු කිරීම සඳහා ස්වාධීනත්වය ලබා දීම**

**පරිපෝෂණ අවධිය**

**අධ්‍යාපනය පරිවර්තනය කිරීම සඳහා නවෝත්පාදන**

එළඹෙන වසර 4 සිට 10 දක්වා වන කාල පරිච්ඡේදය, අධ්‍යාපනයේ අපේක්ෂිත පරිවර්තනීය වෙනසක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන විවිධ වූ නවෝත්පාදනයන් පරිපෝෂණය කිරීමේ කාලසීමාව ලෙස සැලකිය යුතුය.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව, අනාගත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සියල්ල සඳහා මාර්ගෝපදේශ සැපයෙන ලේඛනය විය යුතුය.

යෝජිත ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇති ප්‍රතිපත්තිමය මූලධර්ම සහ ප්‍රකාශ මත පදනම්ව, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද සකස් කිරීමට රෙගුලාසි සහ නීති සම්පාදනය කිරීම, ආයතනික/ පරිපාලනමය ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීම, විෂයමාලා සංවර්ධනය, ප්‍රමිති සහ ආයතනික මිණුම් දඬු සකස් කිරීම යනාදිය ආශ්‍රිත පුළුල් පරාමිතීන් ස්ථාපිත කිරීමට හා විවිධ ප්‍රාග්ධන අපේක්ෂා මාදිලි විශ්ලේෂණය කර නිර්දේශ කිරීමට දේශීය හා ජාත්‍යන්තර විශේෂඥයින්ගේ සහාය ලබා ගත යුතුව ඇත.

අපේක්ෂිත පරිවර්තනීය වෙනස සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ආයෝජන ලෙස; දැනටමත් පවතින ඌන උපයෝජිත සම්පත් නැවත නිසි ක්‍රමෝපායයන් හරහා යෙදවීම (redeployment), රාජ්‍ය, පෞද්ගලික හා ලාභ පරමාර්ථ නොකරගත් භාරයන් වන රාජ්‍ය නොවන ආයතනීය ව්‍යුහයන් (non-state entities) සමඟ ඇතිකර ගන්නා නව උපාය මාර්ගික හවුල්කාරිත්වයන් හරහා සලසා ගන්නා අතිරේක සම්පත් තුලින් සම්පූර්ණ කර ගැනීමට යෝජනා කෙරේ. කෙසේ වෙතත් ඊට පරිභාහිරව අවශ්‍ය වන අත්‍යවශ්‍ය ප්‍රාග්ධන ආයෝජන, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවෙහි හඳුනාගෙන ඇති ප්‍රමුඛතාවලට අනුකූලව යෙදවිය යුතුව ඇත.

## ප්‍රතිපත්ති ක්‍රමෝපායයන්

### ඉලක්කය

ආර්ථික සහ සමාජීය සංවර්ධන ක්‍රියාවලීන් වේගවත් කිරීම සඳහා අධ්‍යාපනික පද්ධතිවල සිදුවන ඉගැන්වීම්, ඉගෙනුම් හා සහතිකකරණ, යහ කළමනාකරණය සහ ආයෝජන හා සම්පත් යනාදි ක්ෂේත්‍ර ක්‍රමිකව වෙනසකට භාජනය කරමින් අධ්‍යාපන පද්ධතියේ ප්‍රවේශ, ගුණාත්මකභාවයන්, අදාලත්වය මෙන්ම ඩිජිටල් පරිවර්තනයන් තිරසාර අයුරින් ඉහළ නැංවීම.

### මූලික අභිමතාර්ථ

- වඩාත් ඵලදායි හා නවෝත්පාදක හැකියාවන්ගෙන් පිරිපුන් රට පිළිබඳ අභිමානයෙන් යුත් පුරවැසියන් බිහිවීම
- ශ්‍රී ලංකාව, කලාපීය අධ්‍යාපන කේන්ද්‍රයක් ලෙස ආකර්ශනීය කරවීම
- සෑම සිසුවකු සඳහාම ඩිජිටල් ඉගෙනුම ලැබීමට හා ප්‍රමාණාත්මක ඩිජිටල් සාක්ෂරතාව අත්කර ගැනීම පිණිස සමාන අවස්ථා සැලසීම
- නුපුහුණු ශ්‍රමිකයින් ශ්‍රම බලකායෙන් 10% දක්වා අඩු කිරීම
- ජාති, වර්ග, කුල, ආගම්, ජාතිකත්වන්, භාෂා, ආදායම හෝ ආබාධිත තත්ත්වයන් කිසිවක් නොසලකා සෑම දරුවකු සඳහාම අධ්‍යාපනයට ඇති සමාන ප්‍රවේශය තහවුරු කිරීම
- අධ්‍යාපන ක්‍රම අඛණ්ඩ සමාලෝචන ක්‍රියාවලින් හරහා ගෝලීය තරඟකාරිත්වයන්ට අනුගත වන ලෙස යාවත්කාලීන කිරීම
- ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලීන් අන්තර් ක්‍රියාකාරී, ආකර්ශනීය, පරිපූර්ණ සහ ඩිජිටල් හැකියාවන්ගෙන් පරිපූර්ණ කෙරෙන ක්‍රියාවලියක් බවට පත් කිරීම.

### අභිමුඛව ඇති ප්‍රධාන අභියෝග

- අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ ආයතන බොහෝමයක් පොදු අභිමතාර්ථ ලඟා කර ගැනීම පිණිස සාමුහිකව නොව තනි තනිව කටයුතු කිරීම.
- විභාග කේන්ද්‍රීය ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලි නිසා දරුවන්ගේ නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදක හැකියාවන් අධෛර්යමත්වීම.
- ප්‍රධාන අධ්‍යාපන ප්‍රවේශ ඔස්සේ නිසි අන්තර් සම්බන්ධිත බහුවිධ ප්‍රවේශ ඉඩකඩ අවකාශ නොමැතිවීම.
- ශ්‍රී ලංකාව පුරා ඩිජිටල්මය වශයෙන් විශාල විභජනයක් සහ පුළුල් අසමානතාවන් පැවතීම.
- ආර්ථික හා සමාජීය ලෙස ඉහළ බලපෑමක් හා ප්‍රතිඵල ලබාදෙන ක්ෂේත්‍ර සඳහා ප්‍රමාණවත් අයුරින් ආයෝජන සිදු නොවී පවතින අතර සිදුකර ඇති ආයෝජන මත ලබන ප්‍රතිලාභ අධීක්ෂණය හෝ තක්සේරු කිරීමක් සිදු නොකිරීම.

## අපේක්ෂිත ප්‍රධාන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ

මෙම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති කෙටුම්පත් රාමුවෙහි දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා අපේක්ෂා කරන ප්‍රධානතම පරිවර්තනීය ප්‍රතිසංස්කරණ පහත වගුව මඟින් පිළිබිඹු කෙරේ. එකී පරිවර්තනීය ප්‍රතිසංස්කරණ අදාළ එක් එක් දිශානතීන්ට අනුව පෙළගස්වා ඇති අතර පරිශීලනයේ පහසුව තකා අධ්‍යාපන ක්‍රියාවලියේ උප අංශවලට අදාල වර්ණ කේත අනුව සූචි ගත කර ඇත.

**සූචිය**

| |
|---|
| මුල් ළමාවිය අධ්‍යාපනය |
| සාමාන්‍ය අධ්‍යාපනය |
| තෘතීයික අධ්‍යාපනය (උසස් + වෘත්තීය) |
| අධ්‍යාපනයේ සියලු අංශ |

වගුව 1 - සිදු කිරීමට අපේක්ෂිත ප්‍රධාන පරිවර්තනයන්ගේ සාරාංශය

| සන්දර්භය | අපේක්ෂිත පරිවර්තනීය වෙනස | ප්‍රතිපත්ති ප්‍රකාශයේ යොමුව |
|---|---|---|
| ඉගැනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය | 1. ‘ආගම් සහ සාරධර්ම’ යන විෂය හැදෑරීම හරහා. සංහිඳියාවෙන් යුත් සමාජයක් බිහි කිරීම උදෙසා සිසුන් හට සියලු ආගම් පිළිබඳ ඉගෙනීමට අවකාශය ලබා දීම | 6.4 |
| | 2. ඕනෑම පාසලක් ආශ්‍රිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව සිසුන්ට සහතික කිරීම. | 6.2 |
| | 3. සෑම සිසුවකු හටම අධ්‍යාපනයේ එක් එක් අදියරය සඳහා අදාළ වන පරිදි, ජාතික භාෂා ද්විත්වයක්, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ ඩිජිටල් සාක්ෂරතාවය යන ක්ෂේත්‍රයන්ගෙන් නිපුණතාව සහතික කිරීම. | 6.1 |
| | 4. සියලුම පන්ති කාමර සඳහා මිශ්‍ර ඉගෙනුම් ක්‍රියාවලියක් (Blended Learning), විද්‍යාව - තාක්ෂණය - ඉංජිනේරු - කලා - ගණිතය (STEAM), සතිමත්භාවය පදනම් කරගත් ඉගෙනුම් ක්‍රමවේද (Mindfulness Learning) මෙන්ම 21 වැනි සියවසට ගැළපෙන අනෙකුත් ප්‍රවේශයන් අදාල කර ගැනීම | 6.8 |
| | 5. සියලුම සිසුන් වෙත කෘත්‍රිම බුද්ධිය, දේශගුණික විපර්යාස, තිරසාර සංවර්ධනය සහ අනෙකුත් නැගී එන ගෝලීය ප්‍රමුඛතා පිළිබඳ දැනුම ලබාදීම සහතික කිරීම. | 6.9 සහ 6.11 |
| | 6. විෂයමාලා සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් හරහා ව්‍යවසායකත්වය, මූල්‍ය සාක්ෂරතාවය සහ අනෙකුත් ක්‍රියාකාරී කුසලතා දැනුම ලබාදීම සහතික කිරීම. | 6.10 |
| | 7. අධ්‍යාපනයේ සෑම අදියරයක් සඳහාම වත්මන් ජාත්‍යන්තර ප්‍රමිති මිණුම් දඬුවලට සමානව ප්‍රමිතිගතවූ විෂයමාලා සහ ඇගයීම් ක්‍රියාවලි හඳුන්වාදීම. | 6.12 සහ 6.23 |

| සන්දර්භය | අපේක්ෂිත පරිවර්තනීය වෙනස | ප්‍රතිපත්ති ප්‍රකාශයේ යොමුව |
|---|---|---|
| | 8. යෝජිත එක් ප්‍රමිතිගත නිපුණතා කවුන්සල විසින් සංවර්ධනය කරනු ලබන ආර්ථිකයේ ප්‍රධාන අංශවලට අදාළ නිපුණතා සංවර්ධන නව ප්‍රමිති සහ විෂයමාලා හඳුන්වාදීම. | 6.13 |
| | 9. වෘත්තීය හෝ රැකියා අභිමුඛ ප්‍රවේශ කුසලතා සම්පූර්ණ කර ගැනීම සඳහා බහුවිධ ක්‍රමෝපායන මාර්ග සමඟ ඒකාබද්ධ වූ අධ්‍යයන සහ/ හෝ ජීවන කුසලතා ආශ්‍රිත විෂයයන් හඳුන්වාදීම. | 6.18 |
| | 10. 12+ වසරක අධ්‍යාපනය නිමා කිරීම සහතික කරමින් ඉගෙනුම් ක්‍රියාවලියේ සමස්තයම ග්‍රහණය කරගත්, 11 වසර සහ 12+ වසර අවසානයේදී සියලුම සිසුන් වෙත සම්පූර්ණ කිරීමේ සහතිකයක් (Completion Certificate) ලබාදීම. | 6.16 සහ 6.17 |
| | 11. අවසන් විභාග සඳහා දැනට තබා ඇති බර තැබීම් අවම කරමින් ව්‍යාපෘති පාදක ඇගයීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම. | 6.6 සහ 6.17 |
| | 12. ඕනෑම අවදියකදී යලි අධ්‍යාපනයට ප්‍රවේශවීම සහ වැඩසටහන් අතර මාරුවීමේ අවස්ථාව සිසුන් හට ලබාදීම. | 6.17 |
| | 13. මූලික මෙන්ම ප්‍රධාන අධ්‍යයන අදියරයන්හිදී වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම අනිවාර්ය කිරීම. | 6.22 |
| | 14. ජාත්‍යන්තර සහ දේශීය අධ්‍යාපන සුදුසුකම් අතර සංධානය සහ මාරු කිරීම් සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | 6.24 |
| | 15. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හට නිසි අධ්‍යාපන අවස්ථා ලබාදීම සහතික වනු පිණිස අවශ්‍ය පහසුකම් සලසන, සැමට විවෘත වූ ඉගෙනුම් ප්‍රවේශ හඳුන්වාදීම. | 6.26 |
| | 16. ඉහළ අධ්‍යාපනික සාධනයක් පෙන්නුම් කරනු ලබන අති දක්ෂ සිසුන් සඳහා වූ කඩිනම් ඉගෙනුම් ක්‍රියාවලියක් හඳුන්වාදීම. | 6.27 |
| | 17. ගුරු වෘත්තීය ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ප්‍රමිති කිරීම සහතික කිරීමේ නව යාන්ත්‍රණයක් සහිත ස්වාධීන ගුරු වෘත්තීය සභාවක් ස්ථාපිත කිරීම මඟින් සහ ගුරු වෘත්තීය ඉහළ වැටුප් තලවලින් සමන්විත ආකර්ෂණීය වෘත්තියක් බවට පරිවර්තනය කිරීම. | 6.28 |
| | 18. ඉහළ වෘත්තීය දායකත්වයක් සැපයීම පිණිස ගුරුවරුන් සහ අධ්‍යාපනඥයින් වෙත අඛණ්ඩ පුහුණුව සහ ධාරිතා සංවර්ධනය ක්‍රියාත්මක කිරීම. | 6.29 |
| | 19. අධ්‍යාපනයේ සියලුම අදියරයන් ආශ්‍රිතව සීමාවාසික පුහුණුව සහ ආධුනිකත්ව පුහුණු අවකාශයන් පුළුල් කිරීම. | 6.30 (1)(ඇ) |
| | 20. ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රබල ඉගෙනුම් මෙවලමක් ලෙස අනෙකුත් තාක්ෂණයන්ද ඇතුළු කෘත්‍රිම බුද්ධිය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රමිතිගතව බද්ධ කිරීම. | 6.29 (2) |
| | 21. විෂයමාලා සහ ප්‍රමිතීන් ජාත්‍යන්තර මට්ටමට ගැලපෙන අයුරින් වැඩිදියුණු කර ගැනීමට ගෝලීය ආභාෂය සහ සහයෝගිතාවය සඳහා ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා | 6.29 (3) |

| සන්දර්භය | අපේක්ෂිත පරිවර්තනීය වෙනස | ප්‍රතිපත්ති ප්‍රකාශයේ යොමුව |
|---|---|---|
| | ගුරුභවතුන් හට ඉඩකඩ හා අවස්ථා පුළුල් කිරීම. | |
| පාලනය | 22. ප්‍රතිපත්තිමය දිශානතිය කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම සහතික වනු පිණිස සම්ප්‍රදායික පරිපාලන කටයුතුවලින් නිදහස් වූ අධ්‍යාපන අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීම. | 7.1 සහ 7.3 |
| | 23. අධ්‍යාපන අමාත්‍යවරයා වෙත උපදෙස් ලබාදීමට නිල ආයතනික නව ව්‍යුහයන් ත්‍රිත්වයක්;<br>- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රතිස්තාපනය කරමින් අධ්‍යාපනය සඳහා ජාතික උපදේශන කමිටුව.<br>- අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රමිතිගතව අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ නිල විශේෂඥ කමිටුව.<br>- පළාත් අධ්‍යාපන අධිකාරීන්ගෙන්ද සමන්විත වූ නව ඒකාබද්ධ කළමනාකරණ ව්‍යුහයක්. | 7.2 |
| | 24. පළාත් අධ්‍යාපන මණ්ඩල මගින් ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් නව විද්‍යාල සහ පලාත් විශ්වවිද්‍යාල පිහිටුවීම | 7.4 |
| | 25. දිවයිනේ සියලුම පාසල් උසස් ප්‍රමිතිගත පළාත් පාසල් ලෙස පරිවර්තනය කරමින් ජාතික පාසල් සංකල්පයෙන් බැහැරවීම. | 7.5 |
| | 26. තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සංවර්ධනය හා යහ කළමනාකරණය සඳහා ස්වයං තීරණ ගැනීමේ බලතල සහිත ප්‍රාදේශිය අධ්‍යාපන මණ්ඩල පද්ධතියක් ස්ථාපනය කිරීම | 7.5 |
| | 27. මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය, ජාතික අධ්‍යාපන ආයතනය වෙත අන්තර්ග්‍රහණය කරමින් එක් ප්‍රමිතිගත සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියකට අනුගතවීම | 7.6 |
| | 28. වර්තමාන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, දැනට පවතින සියලුම රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු සපයන්නන් ඒකාබද්ධ කිරීම සඳහා වූ විධිනියෝගයක් සහිතව ජාතික නිපුණතා කොමිෂන් සභාව බවට පරිවර්තනය කිරීම . | 7.7 |
| | 29. වර්තමාන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සියලුම උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ බලතල සහිත වගකීම දරන ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව බවට පරිවර්තනය කිරීම. | 7.8 |
| | 30. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුම අධ්‍යාපනික සේවා සපයනු ලබන ආයතන සඳහා නිසි ප්‍රමිතිගත සීමාවන්ට අනුකූලව ජාතික සහ පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් නියම කරනු ලබන මාර්ගෝපදේශ යටතේ වඩාත් ස්වයං පාලිත තත්ත්වයක් ඇති කිරීම. | 7.4 සහ 7.10 |
| | 31. සෑම වසරක් පාසාම වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හරහා ජාතික අධ්‍යාපන කාර්යය සාධනය පිළිබඳ අමාත්‍යවරයාගේ වගවීම ශක්තිමත් කිරීම. | 7.1 |
| | 32. සියලුම අධ්‍යාපනික අංශ තුළ සමාන ගුණාත්මක තත්වයන් තහවුරු කිරීම පිණිස ඒකාබද්ධ තත්ත්ව සහතික කිරීම් සහ | 7.9 |

| සන්දර්භය | අපේක්ෂිත පරිවර්තනීය වෙනස | ප්‍රතිපත්ති ප්‍රකාශයේ යොමුව |
|---|---|---|
| | ප්‍රතීතනය (Accreditation) සඳහා ජාතික තත්ත්ව සහතික සහ ප්‍රතීතන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | |
| **ආයෝජන සහ සම්පත්** | 33. අධ්‍යාපනයේ සියලුම ක්ෂේත්‍ර ආශ්‍රිතව වඩාත් උසස් ප්‍රමිතිගත අධ්‍යාපනයක් සහතික වනු පිණිස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයන් මෙන්ම රාජ්‍ය නොවන හවුල්කරුවන්ගේ සහභාගීත්වය උනන්දු කරවීම. | 8.1 |
| | 34. මුල් ළමාවිය අධ්‍යාපනය වඩාත් ඉහළ ප්‍රමිතියකට ගෙන ඒම පිණිස විවිධවූ හවුල්කාරිත්වයන් ප්‍රචලිත කිරීම. | 8.2 |
| | 35. සිසුන් බඳවා ගැනීම මෙන්ම පවතින පහසුකම් සහ කාර්ය සාධනය පාදක කරගනිමින්, රජයේ පාසල් සඳහා අරමුදල් සැපයීම. වඩාත් අවාසි සහගත සහ අවදානමට ලක්විය හැකි ළමුන්/ප්‍රජාවන් සහිත පාසල් සඳහා වැඩි මුදල් ප්‍රතිපාදන සහතික වන අයුරුන් විශේෂ විධිවිධාන හඳුන්වාදීම. | 8.3 |
| | 36. තෘතීයික අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන සියලු සිසුන් හට සහාය වනු පිණිස අරමුදල්, ශිෂ්‍ය දායකත්ව මුදල් මෙන්ම ආයතන විසින් ජනනය කරනු ලබන අරමුදල් යනාදි ප්‍රභව මඟින් අරමුදල් සැපයීමේ නව ක්‍රමවේද හඳුන්වාදීම. | 8.4 |
| | 37. තෘතීයික අධ්‍යාපනය සඳහා දැනට භාවිතා වන ඍජු අයිතම පදනම් කරගත් අරමුදල් ක්‍රමවේදයේ සිට සිසුන් බඳවා ගැනීම් කේන්ද්‍ර කරගත් අරමුදල් සැපයීමේ ක්‍රමවේදයක් වෙත පරිවර්තනය වීම සඳහා වූ වසර තුනක සංක්‍රාන්ති කාලයක්. | 8.4 |
| | 38. රාජ්‍ය ප්‍රදාන සහ අනුග්‍රහය සහිතව තෘතීයික අධ්‍යාපනය සඳහා ණය පහසුකම් සලසා ගන්නා සිසුන් හට රාජ්‍ය හෝ රාජ්‍ය නොවන තෘතීයික අධ්‍යාපන ආයතන තෝරා ගැනීමේ අභිමත අයිතිය ලබාදීම. | 8.4 (2) සහ 8.5 |
| | 39. උසස් අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රයේ විදේශීය ආයෝජනයන් සඳහා ඇති සීමාවන් ඉවත් කිරීම. | 8.10 |
| | 40. ප්‍රයෝජනයට නොගත් සහ ඌන උපයෝජිත අධ්‍යාපන පරිශ්‍රයන් දීර්ඝකාලීන කල්බදු පදනම මත නව විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම පිණිස ආයෝජකයින් දිරිගැන්වීමේ නව යෝජනා ක්‍රම. | 8.11 |
| | 41. පර්යේෂණ, ඉගැන්වීමේ නවෝත්පාදන, ඩිජිටල් පරිවර්තන, කර්මාන්ත සමඟ හවුල්කාරිත්වය සහ ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා අධ්‍යාපන ආයතන වෙත තරඟකාරී පදනමින් අරමුදල් සහ/ හෝ දිරිගැන්වීම් හඳුන්වාදීම. | 8.12 |

# පටුන


විධායක සාරාංශය 2

**අධ්‍යාපන පරිවර්තනය සඳහා ප්‍රතිපත්තිමය රාමුව** 2

**පරිවර්තන ක්‍රියාවලිය** 3

**1. හැඳින්වීම** 11

**2. අදාළත්වය සහ විෂය පථය** 12

**3. ප්‍රතිපත්තිමය ඉලක්ක** 13

**4. ප්‍රතිපත්තිමය අරමුණු** 13

**ප්‍රවේශය** 13

**ගුණාත්මකභාවය** 13

**අදාළත්වය** 14

**ඩිජිටල්මය පරිවර්තනය** 14

5. **ප්‍රතිපත්තිමය මූලධර්ම** 15

6. **ප්‍රතිපත්ති ප්‍රකාශ | ඉගෙනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය** 16

7. ප්‍රතිපත්ති ප්‍රකාශන | යහ කළමනාකරණය........................................................................23

8. ප්‍රතිපත්ති ප්‍රකාශ | ආයෝජන සහ සම්පත් .................................................................28

ඇමුණුම............................................................................................................ ...30

# 1. හැඳින්වීම

අධ්‍යාපන ක්ෂේත්‍රය, මෙරට ආර්ථික ක්‍රියාවලින්වල කාර්යසාධනය මෙන්ම ප්‍රතිවර්තනය කෙරෙහි සෘජුව බලපෑම් සිදුකරනු ලබන මානව ප්‍රාග්ධන සංවර්ධනයේ ප්‍රධානතම මෙහෙයුම් යාන්ත්‍රණයයි. එබැවින් රජය, සමාජයීය සහ ආර්ථිකමය පරිවර්තනීය වෙනසක් හරහා බහුවිධ ප්‍රතිඵල අපේක්ෂාවෙන් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ අනුකූලත්වය ඉහළ නැංවීම සඳහා කළයුතු පරිවර්තනීය ප්‍රතිසංස්කරණ සිදුකිරීම වෙනුවෙන් ඇපකැප වී සිටියි. ශ්‍රී ලාංකීය උගත් ශ්‍රම බලකායකට, නොයෙකුත් සංකීර්ණ කාර්යයන් ඉටු කිරීමට, නවෝත්පාදනයට සහ වෙනස්වන සමාජ ආර්ථික සහ පාරිසරික අභියෝගයන්ට මුහුණදීමට හැකියාව ඉතා ඉහළ මට්ටමක ඇති බැවින් තාක්ෂණය සහ විද්‍යාවේ ප්‍රගමනය, තිරසාරත්වය සහ අනාගතය ඉලක්ක කරගත් චින්තනයක් සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ බෙහෙවින් ඉවහල් වනු ඇත. එබැවින්, ගෝලීය වශයෙන් වඩාත් තරඟකාරී පුරවැසියෙක් බවට පත්වීම සඳහා රටේ සමස්ත අධ්‍යාපන පද්ධතියෙහිම ක්‍රමානුකූල නමුත් ස්ථිරසාර පරිවර්තනයක් සිදු කිරීම රජයේ අරමුණ වේ.

සෑම පුරවැසියෙකුටම අධ්‍යාපනය ලැබීමට ඇති ඉඩකඩ, හැකියාව, ඉහළ සාක්ෂරතා මට්ටම් මෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ආදී සාධනීය තත්ත්ව රැසක් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය මේ වන විටත් අත්පත් කරගෙන ඇත. එහෙත් වර්තමාන අධ්‍යාපන ක්‍රමවේද මඟින් සංවර්ධනය සඳහා ඇති විභවය සීමා කරනු ලබන යම් බාධකවලට ද අප මුහුණ දෙමින් සිටිමු. උදාහරණ ලෙස, උසස් අධ්‍යාපනය සඳහා අඩු සහභාගිත්වයක් නිරූපනය වීම, පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදෙස්ගත වීම සහ අධ්‍යාපනය හදාරන්නන් අතර පවතින අයිතිය පිළිබඳ හැඟීම ආදි වූ අභියෝග රැසක් අප ඉදිරියේ පවතී. නිර්මාණශීලිත්වය, නිපුණතාවය සහ රැකියාවක නිරත වීමට ඇති හැකියාව මැනවින් නිර්මාණය නොකරන, යල් පැන ගිය, නම්‍යශීලී නොවන අධ්‍යාපන ක්‍රමවේදයක් තවදුරටත් පවත්වා ගෙන යාම හේතුවෙන් එකී ගැටලු පැන නැඟී ඇත. එබැවින් සාකල්‍යවූත්, දීර්ඝ කාලීනවූත් ඉගෙනුම් ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා ආයතනික වනුහය, විෂය මාලාව, ඉගැන්වීම් සහ ඇගයුම් ක්‍රමවේදවල පරිවර්තනයක් සිදු කිරීම අවශ්‍ය වේ.

මෑත කාලීනව අනපේක්ෂිත අයුරින් අප හට මුහුණපෑමට සිදුවූ දැඩි ආර්ථික පසුබෑම හමුවේ, මෙරට අධ්‍යාපන ක්‍රමයට පුළුල් ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමේ අතිශය කාලීන අවශ්‍යතාව නිරූපණය වේ. උද්ගත වන නොයෙකුත් අභියෝග සඳහා නිර්මාණාත්මක මෙන්ම විචාරාත්මක අයුරින් සාර්ථකව මුහුණදීමට හැකි පුරවැසියන් සහ ශ්‍රමිකයන් සතු ධාරිතා මට්ටම් මත රටේ සංවර්ධනය සහ ප්‍රතිවර්තනයන් රඳා පවතී. එබැවින් එවන් තත්ත්වයක් ළඟා කර ගැනීම උදෙසා ජාතික අධ්‍යාපන ක්‍රමවේදයේ දැනට පවත්නා නම්‍යශීලී නොවන ආකෘතියෙන් දුරස්වී, 2048 තිරසර සංවර්ධන දැක්මට අනුකූලව 21 වන සියවසට ගැළපෙන අයුරින් කුසලතා සහ නිපුණතා සංවර්ධනය කරනු ලබන වඩාත් නම්‍යශීලී පුරවැසියන් නිර්මාණය කෙරෙන නව ප්‍රවේශයක් කරා එළැඹිය යුතුය.

යෝජිත ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2023-2033), සාධාරණ මෙන්ම කිසිවෙකු හෝ වෙනස්කමකට භාජනය නොකෙරෙන (inclusive), සාකල්‍ය (holistic), ඒකාබද්ධ සහ අතිශය විධිමත් අධ්‍යාපන ක්‍රමයක් බවට පරිවර්තනය කිරීමේ 2048 තිරසර සංවර්ධන දැක්මට අනුගතව විවිධාකාර වූ පුද්ගලයන් හැකියාවන්ගෙන් පරිපූර්ණ කිරීම සහ සංවර්ධනය කිරීම හරහා ඔවුන් බුද්ධිමත්, වෙහෙස වී වැඩ කරන සහ පුරවැසි හැඟීමකින් යුතුව කටයුතු කරන්නා වූ පුරවැසියන් බවට පත් කිරීම අරමුණ සකස් කර ඇත.

## 2. අදාළත්වය සහ විෂය පථය

යෝජිත ප්‍රතිපත්ති රාමුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය - 2020 විසින් සිදුකරන ලද පුළුල් අධ්‍යනය මත පදනම්ව හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සම්පාදනය කිරීමේ දී ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තාව මෙන්ම මෙම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා පත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනු කමිටුව වෙත සහාය පළ කිරීම සඳහා පත් කරන ලද විශේෂඥ නිලධාරි කමිටුව යටතේ පිහිටුවනු ලැබූ හර කණ්ඩායම් පහක් විසින් ඉදිරිපත් කරන ලද සාරාංශ වාර්තා ද උපයෝගී කර ගනිමින් සකස් කරනු ලැබ ඇත.

යෝජිත ප්‍රතිපත්ති රාමුව මඟින් දැනට පවතින අභියෝග (ඇමුණුම 1) රාශියක් හඳුනාගෙන ඇති අතර එම අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා අනුගත කරගත යුතු ප්‍රතිපත්තිමය ඉලක්ක, පරමාර්ථ, ප්‍රතිපත්තිමය මූලධර්ම සහ ප්‍රකාශ මැනවින් ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත. අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා නිශ්චිත වූ තාර්කික දිශානතියක් ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත සම්ප්‍රේෂණය කිරීම මෙම ප්‍රතිපත්ති රාමුව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම ප්‍රතිපත්ති රාමුව, අවශ්‍ය පරිදි නිරන්තරයෙන් යාවත්කාලීන සහ සංශෝධනය කළ හැකි ලේඛනයක් ලෙස හඳුන්වාදීමට ද අපේක්ෂා කෙරේ.

ජාතික ප්‍රතිපත්ති ලේඛනයක සඳහන් විය යුතු අත්‍යවශ්‍ය මූලිකාංග වන, ප්‍රතිපත්ති මූලධර්ම සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ගෙන් මෙම ප්‍රතිපත්ති රාමුව සැදුම්ලත් ය. එම මූලිකාංග පහත විස්තර කර ඇති දිශානති ත්‍රිත්වය යටතේ ගොනු කර ඇත.

1) **ඉගෙනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය** දිශානතිය මඟින් අදාළ නීති, විධිවිධාන/ කාර්ය පටිපාටි (procedures) සහ ක්‍රියාවලින්ට (processes) අදාළ සංශෝධන ආවරණය කෙරේ.

2) **පාලනය යන ප්‍රතිපත්තිමය දිශානතිය** තුළින්, අදාළ විෂයන්හි විශේෂිත වගකීම් දරන්නන් (පාත්‍රයන්/ actors) සහ ආයතනවල ප්‍රවර්ධිත සහ සම්බන්ධීකරණ ව්‍යුහය ආවරණය කෙරේ**.**

3) **ආයෝජන සහ සම්පත්** යන දිශානතිය ඔස්සේ, මූල්‍යමය සහ අනෙකුත් සම්පත් නැවත නිසි පරිදි ක්‍රමෝපායනය කරමින් කාර්යයන් සඳහා යෙදවීම (re-alignment) සහ ප්‍රශස්ථකරණය (optimization) ආවරණය කෙරේ.

මෙම ප්‍රතිපත්තිමය දිශානතීන්, අධ්‍යාපන පද්ධති දැනටමත් මුහුණ දෙමින් සිටින ගැටලු හා විසඳුම් ග්‍රහණය කර ගැනීමටත්, සමස්තයක් වශයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහාත් අත්‍යවශ්‍ය වනු ඇත. ඉහත පෙළගස්වන ලද දිශානතීන් මත අධ්‍යාපන ක්ෂේත්‍රයේ අදාළ සියලුම අංග ආවරණය වන තාර්කික හා පුළුල් ප්‍රතිපත්ති රාමුවක් ගොඩ නඟනු ඇත.

## 3. ප්‍රතිපත්තිමය ඉලක්ක

යෝජිත ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ මුඛ්‍ය ඉලක්කය වන්නේ, ඉගෙනුම්, ඉගැන්වීම් හා සහතිකකරණය; පාලනය; සහ ආයෝජනය හා සම්පත් යන තෙවැදෑරුම් දිශානතීන් ආශ්‍රිතව සිදුකල යුතුව ඇති පරිවර්තනීය පද්ධතිමය වෙනස්කම් සිදු කරමින් ආර්ථික සහ සමාජයීය සංවර්ධනය උදෙසා වන ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීම කඩිනම් කිරීම සඳහා පුරවැසියන්ට ප්‍රවිශ්ඨවීමට ඇති අවකාශයන් පුළුල් කරමින් එහි ගුණාත්මකභාවය, අදාළත්වය සහ මනා ඩිජිටල්මය පරිවර්තනයක් සිදු කිරීම ය.

## 4. ප්‍රතිපත්තිමය අරමුණු

### ප්‍රවේශය

- සෑම දරුවෙකුටම ඔහුගේ/ ඇයගේ කැමැත්ත සහ අනන්‍ය වූ හැකියාවන්ට ගැළපෙන පරිදි අධ්‍යාපනික ප්‍රගමනය ළඟා කර ගැනීමට මං පෙත් නිර්මාණය කිරීම.
- වර්ගය, ජනවාර්ගිකත්වය, ආගම, පන්තිය, කුලය හෝ ආබාධිත බව යන කරුණු නොසලකමින් සියලු දෙනාටම සමාන අයුරින් අධ්‍යාපන ප්‍රගමනය සඳහා ප්‍රවේශය සහතික කිරීම.
- සියලුම දරුවන් සඳහා ඩිජිටල් ඉගැනීම සහ ඩිජිටල් සාක්ෂරතාව සඳහා සමාන අවස්ථා හා ප්‍රවේශයන් නිර්මාණය කිරීම.

### ගුණාත්මකභාවය

- ඵලදායි හා නවෝත්පාදක හැකියාවන්ගෙන් යුත්, දැනුවත් හා පුරවැසි හැඟීමක් සහිත පුරවැසියන් අධ්‍යාපන ක්‍රමවේදය තුලින් බිහි කරවීම.
- කාලගුණික විපර්යාස ද ඇතුළුව සමාජ, ආර්ථික, ජීව විද්‍යාත්මක සහ භෞතික පාරිසරිකමය වශයෙන් අවිනිශ්චිත අභියෝගාත්මක අනාගතයක් සඳහා පුරවැසියන් සූදානම් කරවීම.
- ජාත්‍යන්තර ශිෂ්‍ය ප්‍රජාවන්, අධ්‍යාපනික පහසුකම් සපයන්නන් සහ ගුරුවරුන්/ අධ්‍යාපනඥයින් හා පර්යේෂකයින් නිතැතින්ම ආකර්ශනයවීමේ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, තරඟකාරි මට්ටමක පරිවර්ථනය කරමින් 21 වන සියවසේ ප්‍රවනතාව සහ ගෝලීය ප්‍රමිතීන් සමඟ යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක කරවීම.
- අප ශිෂ්‍ය ප්‍රජාවට ලොව පුරා බැබළීමට උපරිම ලෙස අවස්ථාව සැළසෙන අයුරින් අධ්‍යාපන පද්ධතියෙහි ප්‍රමිතීන් සහතිකවීම පිණිස මෙරට අධ්‍යාපන ක්‍රියාවලිය අඛණ්ඩ ඇගයුමට ලක්වන සහ නිරන්තර යාවත්කාලීන වන ක්‍රමවේදයක් බවට පරිවර්තනය කිරීම.



## අදාළත්වය

- ශ්‍රී ලාංකේය සමාජයේ අනාගත හැඩතල මෙරට ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති මඟින් නිරන්තරව පෝෂණය වනු ඇත.
- රටේ ආර්ථික සහ සමාජීය තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟා වනු පිණිස රටේ නුපුහුණු ශ්‍රම බලකාය සමස්ත ජනගහනයෙන් 10% ක් හෝ ඊටත් වඩා අඩු කිරීම.
- සෘජු විදේශ ආකර්ෂණය සහතික වනු පිණිස ගෝලීය වශයෙන් ප්‍රමිතිගත කුසලතා සහ නිපුණතා මට්ටම් අත්පත් කර ගත් ශ්‍රම බලකායකින් සමන්විත කිරීම.

## ඩිජිටල්මය පරිවර්තනය

- අධ්‍යාපනය ලබන්නන් සහ අධ්‍යාපනඥයින් අතර තිරසාර සහයෝගීතාව, සන්නිවේදනය වඩාත් සක්‍රිය කරමින් සියල්ලන් ඇතුළත් වනසේ සකස් වූ අධ්‍යාපනයක් සහතික කිරීම පිණිස, විවිධ ඉගෙනුම් ශෛලීන් සහ හැකියාවන්ට ඉඩ සැලසීම සඳහා ඩිජිටල්කරණය වූ අන්තර්ගතයන්, කෘත්‍රිම බුද්ධිය, ඩිජිටල් වේදිකාවන් මෙන්ම ඉගැන්වීමේ හා ඉගෙනීමේ ඩිජිටල් මෙවලම් වැඩි වැඩියෙන් භාවිතා කිරීම.
- ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලින් අන්තර්ක්‍රියාකාරී, ආකර්ශනීය, සාකල්‍ය මනා සහ ඩිජිටල් භාවිතාවන්ගෙන් සමන්විතව සක්‍රියව සිදුවීම.
- වඩාත් ඉහළ ඉගෙනුම් ප්‍රතිඵල සඳහා අධීක්ෂණයට, හා වැඩිදියුණු කිරීමට මෙන්ම විශ්ලේෂණයන් සඳහා මැනවින් කෘත්‍රිම බුද්ධිය යොදා ගෙන තිබීම.
- අධ්‍යාපන ක්‍රියාවලියේ ඩිජිටල්කරණයන් තුළින්, ස්වයං මෙහෙයවීමක් සහිත පුද්ගල අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි වෙනස් කිරීමේ හැකියාවන්ගෙන් සපිරි (Personalized), ක්‍රියාශීලිව නියැලෙන, අන්තර් සම්බන්ධිත සහ දත්ත මත පදනම් අධ්‍යාපන ක්‍රමවේද නිර්මාණය වීම.
- ඩිජිටල් සාක්ෂරතාවෙන් පරිපූර්ණ මෙන්ම ඩිජිටල් යුගයේ ගතිකත්වයන්, අවශ්‍යතාවන් සහ අවස්ථා සඳහා අනුගතවීමේ හැකියාව සහිත ශිෂ්‍ය ප්‍රජාවක් සිටීම.

# 5. ප්‍රතිපත්තිමය මූලධර්ම

අධ්‍යාපනය මැනැවින් නිර්වචනය කිරීමේ දී සහ නිසි පරිවර්තනයක් සිදු කිරීමේදී එකිනෙකට වෙනස් එහෙත් පුළුල් කාර්යභාරයක් ආවරණය වන පරිදි දිශානතින් තුනට අනුකූලව ප්‍රතිපත්තිමය මූලධර්ම සහ ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

## ඉගෙනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය

නුපුහුණු ජනගහන ප්‍රතිශතය අවම කිරීම, සහතිකකරණයට පාත්‍ර වූ පාර්ශවවල සේවා නියුක්තිය වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදන හා නිර්මාණශීලිත්වයන් පුද්ගලයින් තුල පෝෂණය කිරීම උදෙසා ඉගෙනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණ ක්‍රියාවලින් හරහා අධ්‍යාපනය හදාරන්නන් සියලු දෙනා සඳහාම බාධාවකින් තොරව අධ්‍යාපනය සහ පුහුණු අවස්ථා ප්‍රවේශයන් සහතික කිරීම මඟින් රට තුළ විවිධත්වයෙන් යුතු ගතික මානව ප්‍රාග්ධන සම්පත් සංචිතයක් පවත්වා ගැනීම.

## යහ කළමනාකරණය

මධ්‍යම රජයට ආයතන පද්ධති වෙත සීමා සහිත බලයක් ලබාදීමේ මූලධර්මය මත පිහිටමින් විමධ්‍යගතවූ හා ස්වයං පාලනයක් සඳහා වැඩි අවකාශ සැලසීම සහතික වනු පිණිස, රාජ්‍ය සහ රාජ්‍ය නොවන මෙන්ම පෞද්ගලික යන සියලු අංශවල ක්‍රියාකාරීන් සහ ආයතන පද්ධති හඳුනාගෙන ඔවුන් එම පාර්ශවකරුවන්ගේ භූමිකාවන් හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කිරීම සහ අවසන් ප්‍රතිඵල සියල්ල ජාතික ප්‍රමිතීන්ට අනුකූලවීම සහතික කිරීම පිණිස ඉහළ සිට පහළට තීරණ ගැනීම අවම කිරීම මෙන්ම පද්ධතියේ විවිධ වූ ආයතන හුදකලාව ක්‍රියා කිරීම වැලැක්වීම.

## ආයෝජන සහ සම්පත්

අධ්‍යාපනය සඳහා කිසිඳු අයුරකින් රාජ්‍ය මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ යන ප්‍රවේශ ද්විත්වය ඔස්සේම අධ්‍යාපන අවශ්‍යතා වෙත යොමුවන සියල්ලන් වෙත පහසු ඉගෙනුම් ප්‍රවේශ මාර්ග ඇති කිරීම සහතික වනු පිණිස, ප්‍රයෝජනයට ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා ප්‍රශස්ත කළ යුතු අතර, විෂය බාහිර ක්‍රියාකාරකම් ද ඇතුලත්ව, මුල් ළමාවිය අධ්‍යාපනය සිට වසර 12+ ක පාසල් අධ්‍යාපනය සඳහා සිසුන් හට ගෙවීමට ඇති හැකියාවට කිසිඳු අයුරකින් බාධාවක් නොවන පරිදි අධ්‍යාපනය සඳහා වන රාජ්‍ය අරමුදල්, සාමාන්‍ය අධ්‍යාපනය වෙත යොමු කිරීමට ප්‍රමුඛතා ලබාදිය යුතුය.

# 6. ප්‍රතිපත්ති ප්‍රකාශ | ඉගෙනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය

## විෂය මාලා සහ ඉගෙනුම්

6.1 ප්‍රාථමික, කනිෂ්ඨ ද්විතීයික සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන යනාදී මට්ටම් අවසානයේ දී, සියලුම සිසුන් හට ජාතික භාෂා දෙකෙන් (සිංහල සහ දෙමළ) සහ සම්බන්ධක භාෂාවෙන් (ඉංග්‍රීසි), ගණිතමය හැකියාවෙන් සහ පරිගණක සාක්ෂරතාවයෙන්, අවම ප්‍රවීණතා (නිශ්චය කළ යුතු වන) පෙන්නුම් කළ යුතුය.

6.2 ප්‍රමුඛතාවයන් ලෙස සළකා, ඕනෑම පාසලක ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීමට සිසුන්ට ඇති අයිතිය සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සක්‍රිය කිරීම පිණිස, සාමාන්‍ය අධ්‍යාපනයෙහි ඉගැන්වීම් මාධ්‍යය සමාලෝචනය කර, සුදුසු පරිදි කඩිනමින්ම වෙනස් කිරීමට කටයුතු කළ යුතුය.


6.3 අපගේ ප්‍රෞඪ ඉතිහාසය, සංස්කෘතිය, සාරධර්ම, ජනවාර්ගික හා ආගමික විවිධත්වය පිළිබඳව ශිෂ්‍ය ප්‍රජාව වෙත විෂය මාලාව හරහා අධ්‍යනය කිරීමට කඩිනමින්ම අවස්ථාව සලස්වා දිය යුතු අතර එමඟින් ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සහ අභිමානවත් පුරවැසියන් ලෙස ලෝකයේ ශ්‍රී ලාංකිකයන්ට හිමි ස්ථානය පිළිබඳ හැඟීමක් ඇති කිරීමට කටයුතු කළ යුතුය.

6.4 ආගමික අධ්‍යාපනය ලබාදීමේදී, 'ආගම් සහ සාරධර්ම' නමැති විෂයයක් හරහා සිසුන් තමන් විසින් අදහන ආගමට අමතරව, අනෙකුත් සියලුම ආගම් මෙන්ම සාරධර්මවල මූලික හරයන් පිළිබඳව දැනුවත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

6.5 ඉගෙනුම් ඉලක්ක;

- සෞන්දර්යය සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ලොව ගවේෂණය කිරීම; භාෂාව සහ සාක්ෂරතාවය; චාලක කුසලතා සංවර්ධනය; ගණිතමය හැකියාව; සහ සමාජ හා චිත්තවේගීය සංවර්ධනය ඇතුළත් ප්‍රධාන ඉගෙනුම් ක්ෂේත්‍ර හයක් යටතේ පෙර පාසල් ඉගෙනුම් ඉලක්ක ව්‍යුහගත කළ යුතුය.
- ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය, අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණයෙහි නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රමිතීන් සපුරාලිය යුතුය.
- තෘතියික අධ්‍යාපනය, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) සඳහන් ඉගෙනුම් ප්‍රතිඵලවලට අනුකූල විය යුතුය.

6.6 2023 දී නියමු පදනමින් ඉදිරිපත් කළ විෂය මාලා ප්‍රතිසංස්කරණ, අන්තර්ගතය සරල සහ වඩාත් අර්ථවත් කිරීම; විභාග ආතතිය අවම කිරීම; සහ පාසල් පාදක ඇගයුම් වඩාත් වලංගු කිරීම උදෙසා තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.




6.7 ජ්‍යෙෂ්ඨ ද්විතීයික මට්ටම (වසර 10-11) නිපුණතා සඳහා විෂය තෝරාගැනීමට සහ ඉහළ ජ්‍යෙෂ්ඨ මට්ටම (වසර 12+) සඳහා කුසලතා මාර්ගයට ප්‍රවේශවීමට හැකියාව ලැබෙනු ඇත.

6.8 සමස්තයක් ලෙස, මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේදය (Blended Learning), විද්‍යාව - තාක්ෂණය - ඉංජිනේරු - කලා - ගණිතය (STEAM), සතිමත්භාවය පදනම් කරගත් ඉගෙනුම් ක්‍රමවේදය (Mindfulness Learning) සහ 21 වැනි සියවසට ගැලපෙන අනෙකුත් ඉගැන්වීම් සහ ඉගෙනුම් ප්‍රවේශයන් සියලුම පන්ති කාමර ඉගැන්වීම් සඳහා අදාල කර ගත යුතුය.

6.9 අධ්‍යාපනයේ සෑම මට්ටමකම සිටින සිසුවෙකුටම එක් එක් මට්ටම් සඳහා සුදුසු වන පරිදි, දත්ත සාක්ෂරතාවය, කෘත්‍රිම බුද්ධිය හා එහි සමාජීය බලපෑම් මෙන්ම දත්ත භාවිතයේ දී පෞද්ගලිකත්වය, ආරක්ෂාව, සාධාරණත්වය, වගවීම සහ විනිවිදභාවය සම්බන්ධයෙන්, ඇතිවන ගැටලු පිළිබඳ දැනුවත්වීමට අවස්ථාව ලබාදීම තුළින් සිසුන් දැනුවත් පරිශීලකයන් වීම සහතික කල යුතුය.

6.10 විෂය මාලා හෝ විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් සියලුම අධ්‍යාපන මට්ටම්වල සිටින සෑම සිසුවෙකුටම ව්‍යවසායකත්වය, මූල්‍ය සාක්ෂරතාව, ස්වේච්ඡා සේවය සහ වෙනත් ක්‍රියාකාරී කුසලතා සහ ආකල්ප ඇති කිරීම සඳහා අවස්ථාව හිමිවිය යුතුය.

6.11 පාරිසරික ආරක්ෂාව, තිරසර සංවර්ධනය, දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනයවීම සහ මූල්‍ය අවදානම් කළමනාකරණය වැනි ගෝලීය ප්‍රමුඛතා, ඉගෙනුම් ප්‍රවාහවලට ඒකාබද්ධ කළ යුතුය.

6.12 අධ්‍යාපනයේ සෑම මට්ටමකම ජාතික විෂය මාලා, සුදුසු ජාත්‍යන්තර මිනුම් දඬුවලට අනුව ප්‍රමිතිගත කළ යුතුය.

6.13 අදාළ නිපුණතා සභා මඟින්, ආර්ථිකයේ ප්‍රධාන අංශයන්ට අදාලව සංවර්ධනය කළ යුතු නිපුණතා සඳහා, ප්‍රමිති සහ විෂය මාලා සකස් කළ යුතුය.

## ඇගයීම සහ ප්‍රගමනය

6.14 පාසල් අධ්‍යාපනයේ පහත දක්වා ඇති අදියර හතර මඟින් ලඟා කර ගැනීමට අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සිසුන්ට ප්‍රමාණවත් පරිදි විකල්ප තිබිය යුතුය.

- ප්‍රාථමික (1-5 ශ්‍රේණි; වයස 5-10) - මූලික ජීවන කුසලතා
- කනිෂ්ඨ ද්විතීයික ( 6-9 ශ්‍රේණි; වයස අවුරුදු 10-14) - ජීවිතය සඳහා පදනම
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික I (10-11 ශ්‍රේණි; වයස 14-16) - වෘත්තීය සූදානම සඳහා පදනම
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික II (12-13ශ්‍රේණි;වයස 16-18) - ශාස්ත්‍රීය, වෘත්තීය ජීවිතය සඳහා පදනම

*සටහන: පිළිවෙළින් ජ්‍යෙෂ්ඨ ද්විතීයික I සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික II අදියර, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) අදියර ලෙස හැඳින්වේ.*

6.15 විධිමත් මුල් ළමා විය අධ්‍යාපනයක් මඟින් සිසුන්හට පාසලේ ප්‍රාථමික අධ්‍යාපන මට්ටම සඳහා පෙර සූදානම්වීමට අවස්ථාව ලැබිය යුතුය.

6.16 සියලු දරුවන් වෙත ඔවුන්ගේ ප්‍රාථමික, කනිෂ්ඨ ද්විතීයික සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනික කාර්යයන් නියමිත කාල සීමාවන් තුල සම්පූර්ණ කරමින් වයස අවුරුදු 18 වන විට තෘතීයික අධ්‍යාපනයට හෝ වෘත්තීය පුහුණුවට ප්‍රවිෂ්ටවීමට අවස්ථාව හිමිවිය යුතුය.

එවන් තත්වයන් සහතික කිරීම සඳහා:

- **11 සහ 12+** වසරවලට එළැඹීමේදී, **පාසල් සම්පූර්ණ කිරීමේ සහතිකයක් සඳහා හිමිකම් සැලසෙනු ඇත**: වසර 11 හෝ වසර 12+ සම්පූර්ණ කරන සියලු සිසුන් වෙත තම පාසලේ දී අදාල සම්පූර්ණ ඉගෙනුම් කාලසීමාව ආවරණය කිරීම සහතික වනු පිණිස අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහතිකයක් ප්‍රදානය කෙරෙනු ඇත.
- **කිසිඳු බාධාවකින් හෝ ප්‍රමාදයකින් තොරව සිසුන් හට "11 වසර සිට 12+ වසර" හෝ "12+ වසර සිට තෘතීයික අධ්‍යාපනයට" පිවිසීමේ අවස්ථාව;** ජාතික විභාග ප්‍රතිඵල (සා/පෙළ සහ උ/පෙළ) නිකුත් වන තුරු බලා සිටීමකින් තොරව තම අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහතික මත ඊළඟ අධ්‍යාපනික මට්ටම දක්වා උසස්වීමේ අයිතිය හිමිවනු ඇත.
- **අනිවාර්ය අවම ප්‍රවීණතා මට්ටම්:** සාක්ෂරතාවය, ගණිතමය හැකියාව හා ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ අවම ප්‍රවීණතාවය මෙන්ම පාසල් පාදක විෂයමාලා, විෂය සමගාමී සහ විෂය බාහිර පැවරුම් සම්පූර්ණ කිරීම, අධ්‍යාපනය අවසන් කිරීමේ සහතිකය ලබා ගැනීම සඳහා අනිවාර්ය වනු ඇත.
- ජාතික විභාග (සා/පෙළ සහ උ/පෙළ) ප්‍රතිඵල නිකුත් වන තුරු බලා සිටීමකින් තොරව සියලුම සිසුන් හට ඔවුන්ගේ අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහතික මත වැඩිදුර අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ඇතුළත් වීමට ඉඩකඩ සැලසෙනු ඇත.
- අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස (උ/පෙළ) හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ), සිසුන් හට තම වැඩිදුර අධ්‍යාපනය සහ පුහුණු අභිලාෂයන් සඳහා පමණක් වැදගත් වනු ඇත.
- අ.පො.ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල, පාසල් මණ්ඩල වෙත සිසුන්ගේ අ.පො.ස (උ/පෙළ) විෂය ධාරා වෙනස් කිරීමට මෙන්ම වෙනත් පාසල් මණ්ඩල බල ප්‍රදේශයකින් සිසුන් ඇතුළත් කර ගැනීම යනාදිය සඳහා උපයෝගී කරගත හැකිවනු ඇත.
- **ජාතික විභාග/ඇගයුම් සඳහා නීත්‍යානුකූලව නියම කරන ලද කාල රාමු:** අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විෂය පරීක්ෂණ ප්‍රතිඵල හා NVQ සහතික නිකුත් කරනු ලබන පළාත් හෝ ජාතික අධිකාරීන් මෙන්ම පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහතික ප්‍රදානය කරන පාසල් මණ්ඩල විසින්, නිශ්චිත දින වකවානු තුළදී විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම මින් ඉදිරියට නීතිමය අවශ්‍යතාවයක් වනු ඇත.

- ජ්‍යෙෂ්ඨ ද්විතීයික-II මට්ටම වෙත පිවිසෙන සිසුන් හට ශාස්ත්‍රීය, වෘත්තීය හෝ මිශ්‍ර විෂය ධාරාවන් අනුගමනය කිරීමට සහ වයස අවුරුදු 18 දි අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා විකල්ප අවස්ථාව ලැබෙනු ඇත.

6.17 අවසාන විභාග සඳහා දැනට පවත්නා බර තැබීමට සාපේක්ෂව අඩු බරක් තැබෙන අතර, සම්භවන සහ විභව ව්‍යාපෘති මත පදනම් වූ වැඩ පැවරුම් ආශ්‍රිත ඇගයීම් කෙරෙහි ඉහළ අවධානයක් යොමු කිරීම සහතික කිරීම මඟින් තාර්පික චින්තනය, විශ්ලේෂණාත්මක කුසලතා සහ අනෙකුත් නිපුණතා වසර පුරාවට ඇගයීමට ලක්වනු ඇත.

6.18 වඩාත් සාකල්‍ය සහ සැලසුම් සහගත අධ්‍යාපනයක් සිසුන් වෙත සහතික වනු පිණිස, ද්විතීයික අධ්‍යාපනයේ යෙදෙන සියලුම සිසුන් සඳහා අධ්‍යයන සහ/හෝ කුසලතා පථ ඔස්සේ විවිධ ප්‍රගමන මාර්ග වෙත ප්‍රවේශවීමට ඉඩ සැලසෙන පරිදි අධ්‍යයන සහ/හෝ නිපුණතා මාර්ගවල විෂය සංයෝජනයක් අන්තර්ගත වනු ඇත (රූපය 02).

6.19 විවිධත්වයෙන් යුත් අධ්‍යාපන හෝ වෘත්තීය පුහුණු අවස්ථා ලබාගැනීමේ හැකියාව තහවුරු කිරීම පිණිස හඳුනාගෙන ඇති නව ප්‍රගමන මාර්ගයෙහි (රූපය 02) දක්වා ඇති පරිදි, තමන් යෙදී සිටින වෘත්තියේම ඉහල මට්ටමකට පුහුණු කිරීමට (upskilling) සහ වෙනත් නව වෘත්තියක් සඳහා පුහුණුවීමට (reskilling) හැකිවනු පිණිස ඕනෑම අදියරයකදී නැවත සුදුසු අධ්‍යාපන හෝ වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා ඇතුලත් වීමට මෙන්ම වැඩසටහන් අතර මාරුවීමට හැකියාව ලබාදීමට අවශ්‍ය විධිවිධාන ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව සහ/ හෝ ජාතික නිපුණතා කොමිෂන් සභාව විසින් සලසනු ඇත.

6.20 ශාස්ත්‍රීය අධ්‍යයන මාර්ග අනුගමනය කරන සුළු ප්‍රතිශතයකට පමණක් නොව සියලුම ඉගෙනුම් ලබන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා නව ඇගයීම් ක්‍රම සැලසුම් කෙරෙනු ඇත.

6.21 සිසුන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට/ භාරකරුවන්ට, සිසු අවශ්‍යතා, කුසලතා සහ ධාරිතාව මත පදනම්ව පාසල් අධ්‍යාපනයේ එක් එක් ප්‍රධාන අදියරවල දී, ඇගයීම්, පැවරුම් සහ මඟපෙන්වීම් සැපයීම පිණිස සුදුසුකම් ඇති මාර්ගෝපදේශක උපදේශකවරුන් මඟින්, නිපුණතා සංවර්ධන විකල්ප ඇතුළුව තෘතීයික අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනික ප්‍රවේශ සම්බන්ධයෙන් අනිවාර්ය වෘත්තීය මාර්ගෝපදේශනයක් ලබාදෙනු ඇත.

6.22 සුදුසු හා කාලීන ජාත්‍යන්තර මිනුම් දඬුවලට අනුකූලව ජාතික ඇගයුම් ප්‍රමිතිගත කෙරෙනු ඇත.


6.23 මුල් ළමාවිය අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා ඕනෑම මට්ටමකදී ශිෂ්‍යයෙකුට වඩාත් සුමටවූ ප්‍රගමනයක් අත්පත් කරගැනීමට පහසුකම් සැලසීම පිණිස, ජාත්‍යන්තර සහ දේශීය අධ්‍යාපන සුදුසුකම් අතර සන්ධානය සහ මාරු කිරීම් කඩිනමින් සිදු කිරීමේ හැකියාව සැලසෙනු ඇත.

6.24 අධ්‍යාපන ආයතනයක නියමිත අධ්‍යයන කාලසීමාව තුල සිසුන් රඳවා ගැනීමේ අනුපාතය, අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අනුපාතය මෙන්ම සම්පූර්ණ කිරීමට ගතවන කාලය ඉදිරියේ දී ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අනුගත කෙරෙනු ඇත.

6.25 විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සහ විශේෂ අවධානයන්ට ලක්විය යුතුව ඇති සිසුන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා කටයුතු කිරීමේ දී එම ශිෂ්‍ය පිරිස් වෙතද සම අවස්ථා හා ප්‍රවේශයන් (Inclusive learning approaches) සඳහා පහසුකම් සැලසෙනු ඇත.

6.26 ඉහළ ඉගෙනුම් සාධනයක් සහිත සිසුන්ගේ ඉගැන්වීම් අවශ්‍යතා සපුරාලීම සහතික වනු පිණිස කඩිනම් ඉගැනුම් ක්‍රියාවලි ධාරා හඳුන්වාදීම සහ පහසුකම් සැලසීමට කටයුතු කෙරෙනු ඇත.

**නුපුහුණු ජනගහනය අවම කිරීම සහ සැමට බාධාවකින් තොරව අධ්‍යාපන අවස්ථා රැසක් ලබා දීම පිණිස නව ප්‍රගති මාවතක් (රූපය 1)**




(1) අ.පො.ස (උසස්/පෙළ) හෝ සමාන මිනුම් අදියරකදී ISCED 3 මට්ටමට නැවත ඇතුළත් වීම නිර්වචනය කළ යුතුය.
(2) අවශ්‍ය පරිදි ඉහළ නිපුණතාවය සහතික කර මිනුම් විෂය පථයකට ඇතුළු විය හැකිය.
(3) උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා පදනම හෝ වෙනත් කුසලතා සුදුසුකම් විකල්ප තුළ ඇතුළත් විය හැකිය.
(4) 1-13 පාසල් වර්ෂ අවධිය අනාගත තත්වයන් අනුව සකස් කළ හැකිය.

**කෙටි යෙදුම්:** NVQ–ජාතික වෘත්තීය සුදුසුකම්

## ගුරු / අධ්‍යාපනඥ සංවර්ධනය

6.27 පහත සඳහන් වෘත්තියමය ප්‍රතිෂ්ඨාපනයන් මඟින් මුල් ළමාවිය, ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ ගුරු වෘත්තිය, ඉතා ඉහල පිළිගැනීමක් ඇති වෘත්තියක් බවට පරිවර්තනය වනු ඇත;

- ගුරු සේවාවේ වෘත්තීයමය ගුණාත්මකභාවය පවත්වාගෙන යාම පිණිස ජාතික ගුරු සහතිකකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම (NTCS).
- විශිෂ්ට ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් හඳුනාගෙන සම්මානයට පාත්‍ර කිරීමේ ක්‍රියාවලියක්.
- අඩු පහසුකම් සහිත හෝ දුෂ්කර/ දුරස්ථ ප්‍රදේශවල ප්‍රජාවන්ට සේවය කිරීම වෙනුවෙන් විශේෂ සේවා සහතික.
- එළැඹෙන නව වෘත්තීය තත්වයන්ට අනුකූලව ගුරු වැටුප් ව්‍යුහ විශ්ලේෂණය සහ යලි සැකසුම.
- අනිකුත් පිළිගත් වෘත්තීන්ට මෙන් ගුරු සේවාව පිළිබඳ තීරණ ගැනීම හා වෘත්තිකභාවයන් ස්ථාපනය කිරීමේ නිල යාන්ත්‍රණය ලෙස ජාතික ගුරු සභාවක් ස්ථාපනය කිරීම.

6.28 වඩාත් ගුණාත්මක සේවාවන් සැපයීම සහතික කරනු පිණිස අධ්‍යාපනයේ සියලුම අංශවල ඉගැන්වීමේ ක්‍රියාවලියේ නිරත ගුරුවරුන් සහ අධ්‍යාපනඥයින් තවදුරටත් අඛණ්ඩව වෘත්තීය කේන්ද්‍රීයව පුහුණු කරනු ඇති අතර, වැඩිදියුණු කළ සේවාවන් සැපයීම සඳහා ගුරුවරුන්ගේ ධාරිතාවන් ඉහල නංවනු ඇත:

- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හට ද ඉගැන්වීම් ක්‍රියාවලියේදී සම අවස්ථා හා සමාන සම්පත් ප්‍රමාණයක් වෙන් කෙරෙන අයුරින් සැකසුනු ප්‍රවේශයක් (inclusive approaches).
- වඩාත් ආරක්ෂිත ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කිරීම මඟින් සාමාජීය සහ චිත්තවේගීය හැකියා සංවර්ධන ප්‍රවර්ධනය.
- තිරසර සංවර්ධනය, දේශගුණික විපර්යාස මෙන්ම අනෙකුත් ජාතික සහ ගෝලීයව අදාළවන ප්‍රමුඛතා සම්බන්ධ අභියෝග ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ ඒකාබද්ධ කිරීම.
- සිසුන්ගේ ඉගෙනුම් අත්දැකීම් පුළුල් කිරීම සහ ශිෂ්‍ය සහභාගිත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් මනා විවිධත්වයකින් යුත් අධ්‍යාපනික මෙවලම් මෙන්ම නිසි භාවිත සන්නිවේදන වේදිකා භාවිතා කරමින් තාක්ෂණය සමග ඒකාබද්ධ වූ අධ්‍යාපනයක් සහ නව්‍ය ඉගැන්වීම් ක්‍රම භාවිතා කිරීම.
- දත්ත විශ්ලේෂණය සහ කෘත්‍රිම බුද්ධිය වැනි සහ නව අධි තාක්ෂණ මෙවලම් සදාචාරාත්මක අයුරින් භාවිතය ප්‍රචලිත කිරීම සහ දත්ත භාවිතයේ දී මතුවන ප්‍රබල අභියෝග ලෙස සලකන පුද්ගලිකත්වය, ආරක්ෂාව, සාධාරණත්වය, වගවීම සහ විනිවිදභාවය පිළිබඳ මාර්ගෝපදේශ සහ රෙගුලාසි පැනවීම.

## හවුල්කාරිත්වයන්

6.29 රාජ්‍ය දායකත්වයට අතිරේකව රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ කර්මාන්ත සමඟ ඇති කර ගන්නා හවුල්කාරිත්වයන් තවදුරටත් දිරිමත් කළ යුතුය. එවැනි හවුල්කාරිත්වයන් සඳහා හඳුන්වා දෙන සමහර ක්ෂේත්‍ර පහත පරිදි වේ;

1. පහත කාර්යයන් ආශ්‍රිතව, ජාතික මෙන්ම ගෝලීය වශයෙන් වැදගත් වන ක්ෂේත්‍රවල **ඉගැන්වීම් සහ පර්යේෂණ** සංවර්ධන-සහයෝගිතාවය;

   අ. තිරසර සහ දේශගුණ හිතකාමී ව්‍යවසායකත්වයන් ආශ්‍රිත දැනුම වර්ධනය පිණිස නව විෂය මාලා සහ වැඩසටහන්; **ස්වේච්ඡා සේවා සඳහා** යාන්ත්‍රණ; සහ ඉගැන්වීම සඳහා නව ඉගැන්වීම් මෙවලම්.

   ආ. පිළිගත් **නිපුණතා ප්‍රමිතීන්ට අනුකූල** විෂය මාලා සහ ඉගැන්වීම සඳහා නිපුණතාවයෙන් සපිරි ගුරුවරුන්.

   ඇ. ද්විතීයික හා උසස් අධ්‍යාපනය මෙන්ම වෘත්තීය කුසලතා සංවර්ධනය යන සෑම ඉගෙනුම් අදියරයකදීම සීමාවාසික සහ ආධුනිකත්ව පුහුණු ඉඩකඩ නිර්මාණය කිරීම තුලින් ප්‍රයෝගික අත්දැකීම් ලබාදීම.

   ඇ. කාර්මික/ ව්‍යාපාරික පරිචයන් මෙන්ම අවශ්‍ය සම්පත් සහ කථිකාචාර්යවරුන් ලෙස අදාළ එක් එක් කර්මාන්ත ක්ෂේත්‍රයේ සැබැවින්ම සේවයේ නියැලෙන පිරිස් වෙත ප්‍රවේශවීම සඳහා සමාගම්, මධ්‍යස්ථාන හා කේන්ද්‍ර (hubs) වැනි ආදර්ශයන් සහ ආයතන පද්ධති හඳුන්වා දීම.

2. පුද්ගලානුබද්ධ සහ සම අවස්ථා හා සම්පත් සැමට සැලසෙන (inclusive) ඉගෙනීම සඳහා ඉගැන්වීම් සහ ඉගැනුම් මෙවලම් ලෙස අනෙකුත් තාක්ෂණයන් සමඟ කෘතිම බුද්ධිය වැනි නව තාක්ෂණයන් ද ප්‍රමිතිගතව ඇතුළත් කිරීම මඟින් **අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය;** අතථ්‍ය ඉගැනුම් සහ අතථ්‍ය (Virtual) විශ්වවිද්‍යාල සඳහා පහසුකම් සංවර්ධනය කිරීම; සහ වෙනස්වන ඉගෙනුම් අවශ්‍යතා සඳහා අනෙකුත් අනුගතවීම්.

3. ජාතික සහ ගෝලීය ප්‍රමුඛතා සම්බන්ධයෙන් ජාත්‍යන්තර දැනුම් හා අත්දැකීම් ලබාගැනීම සහ සහයෝගීතාවන්ට එළඹීම, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම මෙන්ම මුදල් ගෙවා මෙරටින් උසස් අධ්‍යාපනය ලබා ගැනීම පිණිස වැඩි වැඩියෙන් විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම තුලින් බුද්ධිමය පෝෂණය සඳහා **ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිකර ගැනීම.**

## 7. ප්‍රතිපත්ති ප්‍රකාශන | යහ කළමනාකරණය

7.1 **අධ්‍යාපන අමාත්‍යවරයා** ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැකසීම්, ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත අධීක්ෂණය හා ඇගයීම්, පළාත් සැලසුම් ජාතික ප්‍රතිපත්තියට අනුකූලද යන්න සහතික කිරීම පිණිස පළාත් බලධාරීන් සමඟ නිරන්තර සම්බන්ධීකරණය, ගුරු සේවාව හා අනෙකුත් අදාළ අධ්‍යාපන සේවා ප්‍රමිතිකරණය හා නියාමනය කිරීම, සහ ශිෂ්‍ය සුභසාධනය හා ආරක්ෂාව සඳහා පහසුකම් සැලසීම සඳහා පූර්ණ ලෙස වගකියනු ඇත.

අධ්‍යාපන අමාත්‍යවරයා විසින් වාර්ෂික අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය පදනම් කරගනිමින් අධ්‍යාපනික උප අංශ සහ ප්‍රධාන නියාමන/ පරිපාලන ආයතන පාදක කරගත් ජාතික අධ්‍යාපන ප්‍රගතිය හා ප්‍රතිඵල (National Education Outcomes) පාර්ලිමේන්තුවට මෙන්ම මහජනතාවට දැනුවත් කරනු ඇත.

7.2 **අධ්‍යාපන අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා;**

- **අධ්‍යාපනය සඳහා වන ජාතික උපදේශක කමිටුව;** අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබ ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන මුල් ළමාවිය, ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපනය පිළිබඳ ප්‍රවීණත්වය සහ පළපුරුද්ද ඇති කීර්තිමත් අධ්‍යාපනඥයින්ගෙන් සැදුම්ලත්, **අධ්‍යාපනය සඳහා වන ජාතික උපදේශක කමිටුව** විසින් අධ්‍යාපන අමාත්‍යවරයා හට නිසි උපදෙස් හා මඟපෙන්වීම සිදු කරනු ඇත. යෝජිත උපදේශක කමිටුව මඟින්, වර්තමාන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත.
- **අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රමිතිගතව අන්තර්ග්‍රහණය සඳහා වන විශේෂඥ කමිටුව;** අධ්‍යාපනයේ සියලුම උප අංශ ඇතුලත් සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියට මැනවින් හා ප්‍රමිතිගතව තොරතුරු තාක්ෂණය අන්තර්ග්‍රහණය කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය කර ඒවා ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය වෙනුවෙන් තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් ස්ථාපනය වනු ඇත.
- අමාත්‍ය මණ්ඩලය විසින් සියලු පළාත් නියෝජනය වන පරිදි පත් කරනු ලබන **පළාත් අධ්‍යාපන ප්‍රධානීන්ගේ මණ්ඩලයක්** විසින්, අධ්‍යාපන අමාත්‍යවරයා වෙත පළාත් මට්ටමේ අධ්‍යාපන මූලාරම්භයන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සම්බන්ධයෙන් උපදෙස් හා මඟ පෙන්වීම් සලසනු ඇත.

7.3 **අධ්‍යාපන අමාත්‍යාංශය;** කාර්යක්ෂම සහ මනා සම්බන්ධීකරණයක් සහිත ක්‍රියාකාරිත්වයක් සහතික වනු පිණිස **අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරියේදී** පහත සඳහන් අංශ වලින් සමන්විත වනු ඇත;

- ප්‍රතිපත්ති පර්යේෂණ සහ සම්පාදන අංශය
- නියාමන සහ ඇගයීම් අංශය
- ගුණාත්මක තත්ත්ව සහතිකකරණය සහ පාලනය සඳහා වූ පරීක්ෂක මණ්ඩලය
- පළාත් කටයුතු සම්බන්ධීකරණ අංශය
- ඩිජිටල් පරිවර්තන සහ දත්ත කළමනාකරණ අංශය

7.4 **පළාත් අධ්‍යාපන මණ්ඩල**; පළාත්වලට විශේෂිත වූ අවශ්‍යතා සහ තත්වයන්ට ගැලපෙන අයුරින් ජාතික ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් අධ්‍යාපන ප්‍රතිපත්ති සහ භාවිතයන් සකස් කර ඇති බව සහතික කිරීම පිණිස ජාතික ප්‍රමිතීන් තුළ එහෙත් ස්වයං පාලනයක් ඇතිව පළාත් නවයේ පළාත් අධ්‍යාපන මණ්ඩල ස්ථාපනය කෙරෙනු ඇත. පළාත් අධ්‍යාපන මණ්ඩල මඟින් ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් නව විද්‍යාල (Colleges) සහ පළාත් විශ්වවිද්‍යාල පිහිටුවනු ඇත.

7.5 **අධ්‍යාපන සංවර්ධන මණ්ඩල;** අධ්‍යාපන ක්‍රියාවලීන්වල ගුණාත්මක තත්ත්ව සංවර්ධනය සහ කාර්යක්ෂම අධ්‍යාපන පරිපාලනයක් අත්කර ගැනීම සඳහා පළාත් අධ්‍යාපන මණ්ඩලවලට පහළින්, නිශ්චිත නිර්ණායක පදනම් කොටගත් විද්‍යාත්මක පාසල් සිතියම්කරණ ක්‍රියාවලියක් මඟින් ඉදිරියේදී නිර්ණය කරනු ලබන බල සීමා මායිම් ඇතුලත අධ්‍යාපන සංවර්ධන මණ්ඩල ස්ථාපිත කෙරෙනු ඇත. එකී සෑම මණ්ඩලයක්ම, භූගෝලීය සමීපත්වය හා ප්‍රවේශය සැලකිල්ලට ගනිමින් නව බල සීමාවන් නිර්ණය කරන ලද, **පාසල් පොකුරු**වලින් (Clusters of Schools) සමන්විත වනු ඇත. විද්‍යාත්මකව තීරණය කරන ලද පාසල් සංඛ්‍යාවක් සහ ශිෂ්‍ය සංඛ්‍යාවක් මඟින් එම පාසල් පොකුරු සංයුක්ත වනු ඇති අතර එක් පරිපාලන බල සීමාවක් තුළ එවැනි මණ්ඩල එකක් හෝ කිහිපයක් තිබිය හැක.

අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පළාත් බලධාරීන් සමඟ ද සාකච්ඡා කරමින්, සියලුම සිසුන්ට සුදුසු අධ්‍යාපන ප්‍රගමන මාර්ග සඳහා ප්‍රවේශ (රූප සටහන 2) සලසා ඇති බවට සහතික විය හැකි අයුරින් සහ ප්‍රමාණවත් පාසල් සංඛ්‍යාවකින් සෑම අධ්‍යාපන මණ්ඩලයක්ම සමන්විත වන ලෙසින්ද එකී මණ්ඩලවල වර්ගය, සංඛ්‍යාව, බල සීමාව හා මායිම් නිර්ණය කර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ඇත.

සෑම පාසල් පොකුරකටම ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් සිටින බව සහතික කිරීම පිණිස, එක් එක් පාසල් පොකුරට යෝග්‍ය ගුරු සංඛ්‍යාවක්ද ගුරු මාරුවීම් සඳහා යෝග්‍ය නව රෙගුලාසි ද ස්ථාපිත කරනු ඇත.

නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීමත් සමඟම රටතුල පිහිටි සියලුම පාසල්, පළාත් මඟින් කළමනාකරණය කරනු ලබන පාසල් වනු ඇති අතර ජාතික පාසල් ලෙස පවතින වර්තමාන වර්ගීකරණය තවදුරටත් අදාල නොවනු ඇත.

7.6 **ජාතික අධ්‍යාපන ආයතනය (NIE);** පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මුල් ළමාවිය අධ්‍යාපනය, ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය ඇතුළත් වන සාමාන්‍ය අධ්‍යාපනයෙහි විෂයමාලා සහ ප්‍රමිතීන් සංවර්ධනය කිරීම, ගුරුවරුන් සඳහා ගුණාත්මක ගුරු අධ්‍යාපනයක් හා කාර්ය මණ්ඩල වෘත්තීය සංවර්ධනය සැපයීම සහතික වනු පිණිස **ජාතික අධ්‍යාපන ආයතනය (NIE)** වගකීම් දරනු ඇත.

මුල් ළමාවිය සංවර්ධනය සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය ඉදිරියේදී මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා වගකිව යුතු අංශය ලෙස **ජාතික අධ්‍යාපන ආයතනය (NIE)** වෙත අන්තර්ග්‍රහණය වනු ඇති අතර, එමගින් මුල් ළමාවිය සංවර්ධනය සඳහා අදාළවන ආයතන අතර පවතින සම්බන්ධීකරණ ගැටළුව විසඳෙනු ඇත.

7.7 **ජාතික නිපුණතා කොමිෂන් සභාව (NSC);** නිපුණතා සංවර්ධනය සඳහා නැවත සන්නාමනය කරන ලද අධිකාරිය ලෙස **ජාතික නිපුණතා කොමිෂන් සභාව (NSC)** ස්ථාපනය කිරීම මඟින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත. නව කොමිසම නිපුණතා ක්ෂේත්‍ර ආශ්‍රිත සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා සංවර්ධනය, වාර්ෂික ශ්‍රම වෙළඳපොළ සිතියම්ගතකරණය, දැනට පවතින රාජ්‍ය අංශයේ හා රාජ්‍ය නොවන වෘත්තීය

පුහුණු සපයන ආයතන ජාල ගතවන අයුරු පද්ධතියකට අයත් විද්‍යාල පද්ධතියක් එක් ප්‍රමිතිගත විෂයමාලා සමූහයක් ලෙස ඒකාබද්ධ කිරීමට පියවර ගැනීම හා **නිපුණතා කවුන්සිල** පිහිටුවීම සහ ඒවා ස්ථාපිත කර ඇති පරිදි අදාල කාර්යයන් පැවරීම සඳහා වගකියනු ඇත.

7.8 **ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව;** වර්තමාන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යෝජිත ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව (NHEC) මගින් ප්‍රතිස්ථාපනය කරනු ඇති අතර රටතුල ක්‍රියාත්මක සමස්ථ උසස් අධ්‍යාපනය, ජාතික ප්‍රතිපත්තිවලට හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුගතව සම්බන්ධීකරණය කිරීම සහ රාජ්‍ය, රාජ්‍ය නොවන, ජාතික හා පළාත් යන සෑම ආකාරයක් යටතේ ස්ථාපිතව ඇති සියලු උසස් අධ්‍යාපන ආයතන විසින් නිකුත් කරන සියලුම උපාධි, පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි සහ උපාධිවලට සමාන අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වගකියනු ඇත.

ජාතික උසස් අධ්‍යාපන කොමිසම විසින් එක් එක් විශ්වවිද්‍යාල තුල ධනාත්මක අධ්‍යයන වාතාවරණයන් පවත්වාගෙන යා හැකි පරිදි විශ්වවිද්‍යාලයන්හි පරිපාලන, මූල්‍ය සහ අධීක්ෂණ කටයුතුවලින් ඔබ්බට ගිය ප්‍රතිපත්ති සම්පාදන නව ව්‍යුහ ලෙස **විශ්වවිද්‍යාල සභා,** ස්ථාපිත කරනු ඇත.


ජාතික උසස් අධ්‍යාපන කොමිසම මගින්, විදේශීය සිසුන් සඳහා අධ්‍යාපනික වීසා ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ උපාධිය ලැබීමෙන් පසු ඔවුන්ට ද ශ්‍රී ලංකාව තුල රැකියාගත වීමට අවශ්‍ය නම් ඒ සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සම්බන්ධීකරණය කරනු ඇත.

නව විශ්වවිද්‍යාල පිහිටුවීම පළාත් සභා යටතේ සිදු කරනු ඇති අතර දැනටමත් පළාත් බඳව පවතින උපාධි ප්‍රදානය කරන ආයතන නව නීතියක් යටතේ පළාත් විශ්වවිද්‍යාල බවට පත් වනු ඇත.

7.9 **තත්ත්ව සහතික සහ ප්‍රතීතන යාන්ත්‍රණ;** රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශ දෙක මගින්ම ක්‍රියාත්මක වන මුල් ළමාවිය අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය යන සියලුම උප අංශවලට අයත් අධ්‍යාපන ආයතනයන් ආශ්‍රිතව පිළිගත් ස්ථාවර තත්ත්ව ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ජාතික මට්ටමේ **තත්ත්ව සහතික සහ ප්‍රතීතන යාන්ත්‍රණ** ස්ථාපනය කෙරෙනු ඇත.

7.10 ජාතික බලධාරීන්, පළාත් බලධාරීන් සහ අධ්‍යාපන මණ්ඩල විසින් නියම කර ඇති මාර්ගෝපදේශ ඇතුලත සියලුම අධ්‍යාපන සේවා සම්පාදකයින් සඳහා පරිපාලන, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණ සහ සිසුන් තෝරා ගැනීම සම්බන්ධයෙන් ස්වයං පාලනය හිමි වනු ඇත.

## ආදර්ශ පාලන ව්‍යුහය (රූපය 2)




සටහන 1: ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත (1991 අංක 19 දරන) අවලංගු කරමින් එම කාර්යයන් යළි නිර්වචනය කර අධ්‍යාපනය සඳහා ජාතික උපදේශක කමිටුව ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කළ යුතුව ඇත.

සටහන 2: මුල් ළමාවිය අධ්‍යාපනය නියාමනය සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය භාරය නිර්වචනය කර නොමැති වීම ආශ්‍රිතව මතුව ඇති ගැටලුව විසඳීම සඳහා ජාතික මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ලේකම් කාර්යාලය ජාතික අධ්‍යාපන ආයතනයේ කොටසක් ලෙස අන්තර්ග්‍රහය විය යුතුව ඇත.

## 8. ප්‍රතිපත්ති ප්‍රකාශන | ආයෝජන සහ සම්පත්

8.1 රාජ්‍ය අංශයේ ආයතන පද්ධතිවලට අමතරව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇතුළුව සියලුම අංශයන්හි රාජ්‍ය නොවන හවුල්කරුවන්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසෙනු ඇත.

8.2 හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම හරහා මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන තවදුරටත් ප්‍රශස්ථ කළ යුතු අතර, එමඟින් ආර්ථික වශයෙන් ගැටළු ඇති පවුල්වල දරුවන්ට මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීම පිණිස උචිත පරිදි සහනදායි ප්‍රතිපාදන සම්පාදනය කෙරෙනු ඇත.

8.3 රජයේ පාසල්වල ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා මූල්‍යකරණය ඒක - ශිෂ්‍ය පදනම (per-student basis) මත පවතින පහසුකම්වල තත්ත්වය, පාසලේ කාර්ය සාධනය සහ අනෙකුත් නිර්ණායක අනුව සකස් කරන ලද ඒක - ශිෂ්‍ය අනුපාතයකට (per-student ratio) අනුගතව සිදුකරනු ඇත. වත්මන් යෙදවුම්-පාදක මූල්‍යකරණයෙන් නව ක්‍රමවේදයට සංක්‍රමණයවීම සඳහා වසර තුනක කාලයක් ලබා දෙනු ඇත. එහෙත් නොයෙකුත් දුෂ්කරතාවන්ට මුහුණ දී ඇති ළමුන් හෝ ප්‍රජාවන් සඳහා අගතියක් නොවන බව සහතික වනු පිණිස එවැනි සේවා සපයන පාසල් සඳහා ඉහළ මට්ටමේ ඒක - ශිෂ්‍ය අනුපාතයක් අදාළ කර ගනු ඇත.

8.4 රාජ්‍ය ආයතනයන්හි තෘතියික අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන්නන් හට රජය විසින් අරමුදල් ලබා දීම ප්‍රදාන (Grants), සිසු දායකත්ව (Student contributions) සහ අනෙකුත් ආදායම් යන ප්‍රභේද තුනකින් සමන්විත වනු ඇත.

1) රජය විසින් පිරිනමනු ලබන අරමුදල්, ඉගෙනුම් ආයතනයට බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව (enrollment) සහ එහි කාර්ය සාධනය මත පදනම්ව නිර්ණය කරනු ලබන ක්‍රමවේදයකට (formula) අනුව ප්‍රදානය කෙරෙනු ඇත. මෙම ප්‍රදාන යටතට කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩි ඉල්ලුමක් සහිත විෂයයන් හැදෑරීමට බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව සහ අදාළ කර්මාන්ත ආංශික නිපුනතා කවුන්සිල මඟින් සහතික කරනු ලබන අන්තර්කාලීන විධි විධානයක් ක්‍රියාත්මක කිරීම දිරි ගැන්වීම සඳහා ලබා දෙන දීමනා ද අන්තර්ගත විය හැකිය.

2) සිසුන්ගෙන් දායකත්වය ලෙස රජය විසින් පිරිනමනු ලබන ප්‍රදාන සඳහා, රජය විසින් ලබා දෙන ණය පහසුකම් (government-backed loans) සහ පෞද්ගලිකව සිදු කරන ගාස්තු ගෙවීම් (out-of-pocket contribution) අන්තර්ගත වේ. විශේෂ කුසලතා සඳහා නිර්ණායක සහ ස්වකීයව ගෙවීමට ඇති හැකියාව ද ඇතුළත් කර මෙම මූලාශ්‍ර තුන යෙදූ අදාළ ක්‍රමවේදය ඉදිරියේ දී නිර්ණය කරනු ඇත.

3) අමතර ආදායම් ලෙස පර්යේෂණ සහ වාණිජමය ව්‍යාපෘති සඳහා අධ්‍යාපනික ආයතන විසින් උපයා ගන්නා ආදායම් සහ පර්යේෂණ සොයාගැනීම් වානිජකරණය දිරිමත් කිරීම සඳහා වෙන් වූ අරමුදලක් මඟින් ප්‍රදානය කෙරෙන අමතර ආදායම් ගණයට අදාළ වනු ඇත.

වියදම පදනම් කර ගනිමින් ප්‍රතිපාදන ලබා දීමේ ක්‍රමවේදයේ (line-item based funding) සිට බඳවා ගත සිසුන් සංඛ්‍යාව පදනම් කරගත් මූල්‍යකරණයකට සංක්‍රමණය වීම සඳහා වසර තුනක කාල සීමාවක් වෙන්කර දෙනු ඇත.

8.5 පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයන්හි තෘතීයික අධ්‍යාපනය ලැබීමට අපේක්ෂිත සිසුන් සඳහා රජයේ ප්‍රදාන හා සුදුසුකම්ලත් සිසුන් සඳහා රජයේ මූලිකත්වයෙන් ලබාදෙන ණය පහසුකම්, සහ පර්යේෂණ සඳහා ප්‍රතිලාභ ලබාදීම යන මූලිකාංග දෙකින් සමන්විත වනු ඇත.

8.6 රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනයන්හි සිසු දායකත්වය වෙනුවෙන් රජය විසින් ලබා දෙන සහාය සෑම සිසුවකුගේම විශේෂ කුසලතා සහ ස්වකීයව ගෙවීමට ඇති හැකියාව මත පදනම්ව තීරණය කරනු ඇත. එලෙස ලබා දෙන සහාය, රජයේ ආධාර සහ රජය විසින් ලබා දෙන ණය පහසුකම්වලින් සමන්විත වනු ඇත.

8.7 සිය තෘතීයික අධ්‍යාපනය වෙනුවෙන් රජය විසින් ලබා දෙන ණය පහසුකම් ලබා ගන්නා සෑම සිසුවෙකුම ලබාගත් ණය නැවත ගෙවීමේ කොන්දේසි පිළිබඳ දැනුවත් කෙරෙනු ඇත .

8.8 රජයේ ආධාර ලබන සිසුන් විසින් අදාල අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තම සේවා වගකීමක් ලෙස එම සිසුන් සඳහා රජය මඟින් සිදුකල ආයෝජනයට සරිලන වටිනාකමක් නැවත රටට ලැබෙන බව සහතිකවන පරිදි නිශ්චය කෙරෙනු ඇත.

8.9 රාජ්‍ය අරමුදල් ආධාර ලබන සියලුම ආයතන ජාතීන් අතර පවත්නා විවිධත්වය සහ ජාතික වැදගත්කමකින් යුත් වෙනත් නිර්ණායකවලට අනුකූල විය යුතුය. එවැනි වගකීම් බලාත්මක කරනු ලබන්නේ විධාන සහ/හෝ යම් යම් දිරිමත් කිරීම් හරහාය.

8.10 ඉහළ ගුණාත්මක බවින් යුතු ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් යුත් අධ්‍යාපනික ආයතන රටතුලට ආකර්ශනය කර ගැනීම අරමුණු කරගනිමින්, උසස් අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රයේ සෘජු විදෙස් ආයෝජන හිමිකාරිත්වයට අදාළව පනවනු ලැබ ඇති සීමා, ව්‍යාපෘති සඳහා දරනු ලබන අවම ආයෝජන සීමාවක් (investment threshold) හඳුන්වා දීම තුලින් ඉවත් කෙරෙනු ඇත.

8.11 දිවයින පුරා විසිරී පවතින භාවිතයට නොගන්නා හෝ ඌන උපයෝජිත රාජ්‍ය පරිශ්‍ර/ පහසුකම් තුල විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන, බදු පදනමින් යුතුව ස්ථාපිත කිරීමට ආයෝජකයන් හට පහසුකම් සලසනු පිණිස දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් සම්පාදනය කෙරෙනු ඇත.

8.12 තරඟකාරී ප්‍රදාන ලබා දීම සහ/හෝ අධ්‍යාපන ආයතන සඳහා දිරිගැන්වීම් ලබා දීම පිණිස යාන්ත්‍රණයක්; (අ) පර්යේෂණ සංස්කෘතියක් බිහිකිරීම (ආ) ඉගැන්වීමේ නවෝත්පාදන (ඇ) අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය (ඈ) කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ හවුල්කාරිත්වය සහ (ඉ) අන්තර්ජාතික සබඳතා වෙනුවෙන් තරඟකාරී ප්‍රදාන ලබා දීම සහ/හෝ අධ්‍යාපන ආයතන සඳහා දිරිගැන්වීම් ඇතිකිරීම පිණිස යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරෙනු ඇත.

8.13 හවුල්කාරිත්වයන් තුලින්, සියල්ල ඇතුලත් වූ ඉගැනුම් (inclusive learning) සහ ත්වරිත ඉගැනුම් (accelerated learning) සඳහා අවශ්‍ය සම්පත් පහසුකරණය සහ බලමුලුගැන්වීම් අඛණ්ඩව කෙරෙනු ඇත.

# ඉදිරියේ පවතින ප්‍රධාන අභියෝග

## මුල් ළමාවිය අධ්‍යාපනය

1. **ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොමැති වීම;** මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා වන වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ජාතික මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ලේකම් කාර්යාලය (NSECD) සහ පළාත් අධිකාරීන් අතර බෙදී තිබීම. 2020 වර්ෂයේදී මෙම ආයතන ඒකාබද්ධව කටයුතු කිරීම සහතික වනු පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික කළමණාකරන සහ නියාමන කමිටුව (NMRC) පිහිටුවා ඇති නමුදු එහි සම්බන්ධීකරණය ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කෙරේ.

2. **නෛතික වශයෙන් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් නොතිබීම;** අදාළ නීතිමය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් ජාතික මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ලේකම් කාර්යාලයට (NSECD) විෂයගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන ප්‍රමිතීන් බලාත්මක කිරීමට නොහැකි වීම.

3. **පූර්ව ළමාවිය අධ්‍යාපනයෙහි (ECE) සාකල්‍ය ස්වභාවය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම;** එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලට (UNICEF) අනුව මුල් ළමාවිය අධ්‍යාපනය අවධානය යොමුවිය යුත්තේ පාසල තුළ මෙන්ම සමාජීය සහභාගීත්වය සඳහා අවශ්‍යවන, මුල් සංජානන, ශාරීරික සහ සමාජ චිත්තවේගීය කුසලතා මතය. එහෙත් දැනට කියවීම, ලිවීම සහ ගණිතමය හැකියාවන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි ඇති වර්තමාන දැඩි නැඹුරුව සදොස් සහගත වේ.

4. **බහුවිධ ක්‍රියාකාරිත්වයන් පැවතීම හේතුවෙන් ගුණාත්මකභාවයේ විචල්‍යතා පැවතීම;** ශ්‍රී ලංකාවේ පූර්ව ළමාවිය අධ්‍යාපන සේවා සැපයීම බොහෝ දුරට රාජ්‍ය නොවන සම්පත් මත රඳා පවතින අතර, ක්‍රියාත්මකව පවතින පූර්ව ළමාවිය අධ්‍යාපන මධ්‍යස්ථාන 19,000කට වැඩි සංඛ්‍යාවක් පමණ අතුරින් බහුතරයක් රාජ්‍ය නොවන ආයතන ලෙස පවත්වාගෙන යනු ලබයි. මෙම මධ්‍යස්ථාන ආශ්‍රිතව පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් සිදු කරනු ලබන පසුවිපරම් සහ අධීක්ෂණය කිසිදු අයුරකින් ප්‍රමාණවත් නොවන අතර, මුල් ළමාවිය ගුරුවරුන් සහ සුරකුම් මධ්‍යස්ථාන භාරකරුවන් සඳහා වන වැටුප් හා වේතන ගෙවීම් කිසිදු අයුරකින් ප්‍රමාණවත් නොවන අතර, එක් එක් මධ්‍යස්ථාන විසින් සිදු කරන එකී ගෙවීම් එකිනෙක සැසඳීමේ දී විශාල පරස්පරතා පවතින බව නිරීක්ෂණය කෙරේ.

5. **ප්‍රවේශය සහ බඳවාගැනීම් වල අසමානතා;** මුල් ළමාවිය අධ්‍යාපන සේවාවන් (ECE) සඳහා ප්‍රවේශවීමේ සැලකියයුතු වෙනස්කම් පවතින අතර විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් බොහෝමයකට නිසි පූර්ව ළමාවිය අධ්‍යාපන ප්‍රතිලාභ අහිමිවී ඇති බව නිරීක්ෂණය කෙරේ.

6. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්හට ප්‍රමාණවත් අවධානයක් වර්තමානයේ දක්නට නොලැබෙන අතර, සියලු දෙනාටම පොදු නව්‍ය භාවිතාවන් සඳහා කිසිදු ප්‍රවේශයක් එම දරුවන් බොහෝමයක් වෙත නොමැති බව නිරීක්ෂණය කෙරේ.

**ප්‍රාථමික සහ ද්විතීයක අධ්‍යාපනය**

1. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරීන් සහ බොහෝ ආයතන පද්ධති සහජීවනයෙන් ක්‍රියාත්මක වනවා වෙනුවට හුදකලාව හා කිසිදු ඵලදායී සන්නිවේදනයකින් තොරව ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය කෙරේ.

2. ඉහළ සිට පහළට ක්‍රියාත්මක වන සම්ප්‍රදායික තීරණ ගැනීමේ ක්‍රියාවලිය මඟින්, ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියට සම්පවිය යුතු සහභාගිත්වය සහ නව සොයාගැනීම් යටපත් කරමින් ඇති බව නිරීක්ෂණය කෙරේ.

3. ජාතික විභාග සැලසුම් කර ඇත්තේ හුදෙක් සිසුන්ගෙන් ඉතා සුළු ප්‍රතිශතයක් ශාස්ත්‍රීය අධ්‍යයන මාවතකට තෝරා ගැනීම සඳහා වන අතර, 11 වසරට පෙර දළ වශයෙන් 10% ක්, 11 වසරෙන් පසු 25% ක් සහ 13 වසරෙන් පසු තවත් 18% ක් තමන් විසින් පාසලෙහි ගත කරන ලද වසර ගණනාවක කාලය සම්බන්ධයෙන් පෙන්වීමට හැකි සාධන කිසිවක් නොමැතිව පාසල් පද්ධතියෙන් ඉවත්ව යාම නිරීක්ෂණය කෙරේ.

4. වත්මන් විභාග කේන්ද්‍රීය ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය, නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන හැකියාවන් දැඩි ලෙස යටපත් කෙරෙන බව නිරීක්ෂණය කෙරේ.

5. රළු අධ්‍යාපන ප්‍රතිපත්ති මෙන්ම සාකල්‍ය අධ්‍යාපනයකට පහසුකම් සැලසීමට ඇති සීමිත ප්‍රවේශය හේතුවෙන් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දැඩි සීමාවන් පවතින බව නිරීක්ෂණය කෙරේ.

6. ලක්ෂ 2 ක ශිෂ්‍ය ජනගහණයකින් සමන්විත උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙතින් කෙරෙන ප්‍රබල ඉල්ලීම් කෙරෙහි වැඩි ප්‍රතිචාර දැක්වීමට රජයන් විසින් පෙළඹවී ඇති බැවින්, මිලියන 4 කට නොවැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකින් සමන්විත සාමාන්‍ය අධ්‍යාපනය සඳහා රජය විසින් ආයෝජනය කරන ප්‍රතිශතය සීඝ්‍ර ලෙස අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය කෙරේ (රාජ්‍ය අංශයේ (PERC) වියදම් වාර්තාව).

7. වත්මන අධ්‍යාපන ක්‍රියාවලිය තුල ප්‍රධාන අධ්‍යාපන ධාරා ඔස්සේ හරස් සම්බන්ධතා සහිත බහුවිධ අධ්‍යාපනික ප්‍රගමන මාර්ගයන් සලසා නොමැති බව නිරීක්ෂණය කෙරේ.

8. කිසිඳු තාර්ඛික පදනමකින් තොරව ජාතික සහ පළාත් ලෙස පාසල් වර්ගීකරණය කිරීම හේතුවෙන්, ලබා දෙනු ලබන විවිධ පහසුකම් සහ සම්පත් ආශ්‍රිතව විශාල විෂමතාවයක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

9. ජාතිය, භාෂාව සහ ආගම යනාදිය පදනම් කරගත් පාසල් ආරම්භ කිරීම සහ නම් කිරීම හා පවත්වාගෙන යාම ද සමාජයේ වාර්ගික, භාෂාමය හා ආගමික අසමගිය ඇති කිරීමට හෝ අවම වශයෙන් ජාතික සමගියට බාධාවක් වීමට බොහෝ සෙයින් හේතු වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

10. උසස් පෙළ සඳහා පාසල්වල පිරිනමනු ලබන විෂය ධාරාවන්හි දැඩි අසමමිතික ව්‍යාප්තියක් නිරීක්ෂණය කෙරේ.

11. පාසල් අධ්‍යාපනයේ සිට වෘත්තීය අධ්‍යාපනය වෙත ප්‍රවිෂ්ටවීම සම්බන්ධයෙන් සිසුන් විසින් අනුගමනය කළයුතු විධිමත් ක්‍රමවේද හඳුන්වා දී නොමැතිවීම හේතුවෙන් බොහෝ සිසුන් ප්‍රමාණයක් අධ්‍යාපනයෙන් ඉවත් වී නිසි පුහුණුවක් ලබා ගැනීමකින් තොරව රැකියා වෙත යොමු වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

12. Covid-19 වසංගතය ව්‍යාප්ත වූ කාල සීමාවේ දී, ඉගෙනුම් කටයුතු සීමා වීමේ තත්ත්වය තුළ ඉතා නිශ්චිත ලෙස ඉස්මතු වූ රට පුරා පවතින ඩිජිටල් විභේදනය (තාක්ෂණික පරතරය) සහ ඩිජිටල් ව්‍යාප්ති අසමතුලිත තත්ත්වයන් තවමත් එලෙසින්ම පවතින බව නිරීක්ෂණය කෙරේ.

13. කෘත්‍රිම බුද්ධිය, ඩිජිටල් සාක්ෂරතාව, දත්ත විද්‍යාව මෙන්ම ඒ ආශ්‍රිත සදාචාරාත්මක සීමා මායිම් වැනි සංකල්පයන්ගෙන් ඒකාබද්ධ කරනු ලැබූ, අනාගත-කේන්ද්‍රීය විෂයමාලා සඳහා විවෘත වීමට ඇති අවස්ථාව අතිශය සීමිත බව නිරීක්ෂණය කෙරේ.

14. නාගරික පාසල්වලට සමානුපාතිකව අධ්‍යාපනික මෙවලම් සහ වේදිකා (Digital Platform) සඳහා ප්‍රවේශවීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශයන්හි පාසල්වලට නොමැති බැවින් එම පාසල්වල සිසුන්ගේ තරඟකාරිත්වය සැලකිය යුතු ලෙස අඩු බවක් නිරීක්ෂණය කෙරේ.

15. සිසුන්ට තම විභවයන් ප්‍රශස්ථ කර ගැනීමට මග පෙන්වීම සඳහා තිබිය යුතු වෘත්තීය උපදේශන හෝ වෘත්තීය මාර්ගෝපදේශන නොමැති වීම.

16. පවතින අධ්‍යාපන ක්‍රියාවලින් මඟින් ප්‍රමාණවත් ලෙස මෘදු කුසලතා වර්ධනය නොවීම.

17. අතිශය සංවේදී පාරිසරික සාධක සමඟ නිසි ලෙස අන්තර් සම්බන්ධිත නවෝත්පාදන සඳහා වත්මන් අධ්‍යාපනය මඟින් ප්‍රමාණවත් ලෙස ඉඩ සැලසී නොමැති බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස තිරසර සංවර්ධනය සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා පිළිබඳව ඇති අනවබෝධය හා පුරවැසියෙක් ලෙස වගකිව යුතු අවශ්‍යතා සපුරාලීම වළක්වනු ලැබීම.

18. වත්මන් සාමාන්‍ය අධ්‍යාපනයෙහි, දේශගුණික විපර්යාස හා ආශ්‍රිතව වර්ධනය වන ආපදා අවදානම වැනි අවදානම් පිළිබඳ ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රියාවලින් හරහා ජනනය වන විසඳුම් මත පාදක වූ ප්‍රවේශයන් තවමත් ඒකාබද්ධ කිරීමකින් තොව ක්‍රියාත්මක වන බවක් නිරීක්ෂණය කෙරේ.

19. ගුරු වෘත්තිය සඳහා වඩාත්ම කැපවූ හෝ දැනුමැති පිරිස් ආකර්ෂණය නොවන තත්වයක් නිර්මාණය වී ඇති අතර අධ්‍යාපන පද්ධතියේ දැනටමත් සිටින විශිෂ්ට ගුරුවරුන්ට ප්‍රමාණවත් පිළිගැනීමක් හෝ නොලැබීම.

**තෘතීයික අධ්‍යාපනය**
**(තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය ඇතුළත් වේ).**

1. පාසල් හැර යන තරුණ පිරිස් වෙනුවෙන්ම නිර්මාණය කර ඇති තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET) අංශයෙහි සේවා කිසිදු අයුරකින් සිසුන් දිනාගෙන නොමැතිවීම සහ එම අංශයට ඇතුලත් කරගත යුතු කාණ්ඩයේ සිසුන් බොහෝමයක් විසින්ද බාහිර උපාධියක් හෝ හිමිකර ගැනීම සඳහා ඇති ඉල්ලුම වැඩි බවක් නිරීක්ෂණය කෙරේ.

2. ඉදිරිගාමී චින්තන සහ ගෝලීය අභියෝග ආමන්ත්‍රණය කරන ආකාරයේ රැකියා උත්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීම සම්බන්ධ සීමාවන් බොහෝමයක් පවතින බවක් නිරීක්ෂණය කෙරේ.

3. ගුණාත්මක ප්‍රමිතීන් සහ පාලනමය අසංගතතාවන් නියම වත්මන් අධ්‍යාපනික සහ නිපුණතා සංවර්ධන පුහුණුවීම්, ආර්ථිකයේ පවතින රැකියා ඉල්ලුම හෝ කර්මාන්ත අවශ්‍යතා සමඟ අනුරූප නොවීමේ දැඩි ප්‍රවණතාවක් නිරීක්ෂණය කෙරේ.

4. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුකර ඇති රාජ්‍ය ආයෝජන සම්පූර්ණයෙන්ම පාහේ, භූදෙක් සැපයුම් හා යෙදවුම් මත පදනම් වී ඇති බැවින්, සැබැවින්ම ඉහල ආයෝජන ප්‍රතිලාභී ක්ෂේත්‍රවල ආයෝජනය වී නොමැති වීමත් ‘‘ආයෝජනය මත ප්‍රතිලාභය’’ අධීක්ෂණයට හෝ ගණනය කිරීමකට ලක් නොකිරීමේ තත්ත්වයත් නිරීක්ෂණය කෙරේ.

5. ගෝලීය අවදානම් තත්වයන් සැලකිල්ලට ගනිමින්, සේවා නියුක්ති හැකියාව සහ අනාගත ශ්‍රම අවශ්‍යතා මත ඇතිවන ප්‍රධාන බලපෑම් සලකා බැලීමේ සීමාවන් රාශියක් පැවතීම (එනම් සිවිල් සාක්ෂරතාවය; දේශගුණික අර්බුදය; මූල්‍ය සාක්ෂරතාවය; ව්‍යවසායකත්ව කුසලතාවන්)